# තිරසර සංවර්ධන අරමුණු හා අධ්‍යාපනය




CED Sri Lanka
Quality Education For All

අධ්‍යාපන සංවර්ධන සන්ධානය

**ස්තූතිය**

අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් මූලික හා වැඩිහිටි අධ්‍යාපනය සඳහා වූ දකුණු ආසියා පැසිෆික් සම්මේලනයේ **ASPBAE** අනුග්‍රහයෙන් ක්‍රියාවට නංවනු ලබන තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව දැනුම්වත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ මෙම ප්‍රකාශනය සකස් කරන ලදී. එම සංවිධානයට සහ මෙහිදී සහයෝගය ලබාදුන් අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් ඇතුළු සියලුදෙනාට අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ ස්තූතිය පිරිනමනු ලැබේ.

සැප්තැම්බර් 2021

ISBN: 978-624-6002-00-8

**පිටපත:** දිනිති අලහප්පෙරුම

**උපදේශකත්වය:** ශාන්ත කුලතුංග

**සංස්කරණය:** ආනන්ද ජයසේකර

**කවරය සහ පිටු සැකසුම:** නලින්ද සෙනෙවිරත්න

**ප්‍රකාශනය**
අධ්‍යාපන සංවර්ධන සන්ධානය,
අංක 51/1, සිල්වා පටුමග,
රාජගිරිය.
දුරකතනය: 112 887642
විද්‍යුත් තැපෑල: cedsrilanka@yahoo.com
වෙබ්අඩවිය: www.cedsrilanka.org

# පටුන

හැඳින්වීම

1. සංවර්ධන අරමුණු සහ ලෝකයේ සංවර්ධන න්‍යාය පත්‍රයන්

2. සහශ්‍ර සංවර්ධන අරමුණු

3. තිරසර සංවර්ධන අරමුණු

4. තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳ හැඳින්වීමක්

1. දරිද්‍රතාවය සියලුම ස්ථානයන්හි සියලුම ස්වරූපයන්ගෙන් පවත්නා දරිද්‍රතාවය අවසන් කිරීම
2. කුසගින්න නිමා කිරීම
3. සෞඛ්‍ය හා යහපැවැත්ම
4. සැමට අධ්‍යාපනය
5. ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය
6. පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව
7. දරාගත හැකි සහ පිරිසිදු බලශක්තිය
8. ආර්ථික වර්ධනය සහ ගෞරවාන්විත රැකියා
9. තිරසර කාර්මිකකරණය
10. රටවල් ඇතුළත සහ රටවල් අතර ඇති අසමානතාවය අඩු කිරීම
11. තිරසර නගර සහ මානව ජනාවාස
12. තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවක් ඇති කිරීම
13. දේශගුණික විපර්යාස අවම කිරීම

14. ජලයේ ජීවිත

15. මිහිමත ජීවිත

16. සැමට සාමය සහ යුක්තිය

17. පාර්ශවකරණය

5. අධ්‍යාපන අරමුණ හා එහි ඉලක්කයන්

6. ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය

7. මානව අයිතිවාසිකම්

8. සාමය හා සංහිඳියාව සහ තිරසර සංවර්ධන අරමුණු

9. විවිධත්වයට ගරු කිරීම

10. තිරසර ජීවන රටා සහ පරිසරය සුරැකීම

11. තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකාව ගෙන තිබෙන වැදගත් පියවර

# හැඳින්වීම



ඡායාරූපය: Shashank Hudkar on Unsplash

ලෝකයේ සියලුම රටවල ජීවත්වන සියලුම ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම අරමුණු කරගත් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2015 සිට 2030 දක්වා ක්‍රියාත්මක කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලිකත්වයෙන් ලෝක නායකයින් 2015 වසරේදී එකගතාවයකට පත්වූහ. මෙම අත්පොතෙහි අරමුණ වන්නේ සමස්ත තිරසර අරමුණු පිළිබඳවත් ඒවායේ වැදගත්කම පිළිබඳව සහ එම අරමුණු දිනා ගැනීමේදී අප සතුව පවත්නා වගකීම හා කාර්යයභාරයන් පිළිබඳව දැනුම්වත් කිරීමයි.

විශේෂයෙන්ම තිරසර සංවර්ධන අරමුණු දිනාගැනීමේදී සියලුම අංශයන්හි පරිණාමනයක් තුළින් මෙම සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීමට අපේක්ෂා කරන හෙයින් සමාජ පරිණාමනයට ඉවහල්වන දැනුම කුසලතා ලබාදීමට ඉවහල්වන අධ්‍යාපනයට විශේෂ ස්ථානයක් හිමි වේ. එබැවින් මෙහිදී අධ්‍යාපන අරමුණු පිළිබඳවත් එම අරමුණ යටතේ ලඟාකර ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් පිළිබඳවත් අවධානය යොමුකර තිබේ. මේ අතරින් තිරසර අධ්‍යාපනය පිළිබඳව දැනුම්වත් වීම හා ගෝලීය පුරවැසිභාවය සඳහා අධ්‍යාපනය සම්බන්ධයෙන් කරුණු අඩංගුවන 4.7 ඉලක්කය සම්බන්ධයෙන් මෙහිදි විශේෂයෙන් අවධාරණයට ලක්කර තිබේ.

# 1 සංවර්ධන අරමුණු සහ ලෝකයේ සංවර්ධන න්‍යාය පත්‍රයන්

ආර්ථික සහයෝගීතාවය හා සංවර්ධනය පිළිබඳ සංවිධානය

අන්තර්ජාතික මූල්‍ය අරමුදල

ලෝක බැංකුව

පළමු සහ දෙවන ලෝක යුද තත්ත්වයන් අවසන් වීමෙන් පසුව පැවැති සාමකාමී කාල පරිච්ඡේදයේදී විශේෂයෙන්ම 1960 දශකයෙන් පසුව ලෝකයේ එවකට පැවැති විවිධ අන්දමේ ගැටලුකාරී තත්ත්වයන් සමනය කර ගැනීම සඳහා සාමූහිකව ක්‍රියාත්මක වීමේ වැදගත්කම පැහැදිලිව විද්‍යාමාන විය. මේ අනුව ප්‍රධාන ගැටලු වශයෙන් පැවැති දරිද්‍රතාවය, ආහාර හිගකම, අයහපත් සෞඛ්‍ය තත්ත්වයන් ආරක්ෂාව සහ සාමය වැනි සමස්ත ජනතාවගේ යහපැවැත්මට බාධාකාරී වන්නා වූ ගැටලුවලට විසඳුම් ලබාදීම සඳහා අන්තර්ජාතික සංවිධානවල මූලිකත්වයෙන් මේ සම්බන්ධ කතිකාවන් ආරම්භ විය. මෙහිදී පෙරමුණ ගන්නා ලද ආයතන ලෙසට ආර්ථික සහයෝගීතාවය හා සංවර්ධනය පිළිබඳ සංවිධානය, ලෝක බැංකුව හා අන්තර්ජාතික මූල්‍ය අරමුදල වැනි සංවිධාන වැදගත් වේ.

මෙම ප්‍රයත්නයන්හි දක්නට ලැබුණු පොදු ලක්ෂණයක් වන්නේ එක් එක් ගැටලු වෙන් වෙන් වශයෙන් ගෙන ඒවාට සුවිශේෂී වූ විසඳුම් ලබාදීමට උත්සාහ කිරීමයි. කෙසේ වෙතත් පසුකාලීනව සමස්ත සංවර්ධනය ආවරණය කරමින් සකස් කරන ලද සංවර්ධන සැලසුම්වලට පදනම දැමීමට මෙම ප්‍රයත්නයන් මහෝපකාරී විය. මේ යටත් 1990 දශකයේ මුල් භාගයේදී සැලකිල්ලට භාජනය වූ අන්තර්ජාතික සංවර්ධන සැලැස්ම වැදගත්වේ. මෙහිදී ඉහතින් සඳහන් කරන ලද මූලික ගැටලුවලට අමතරව මානව අයිතිවාසිකම් කාන්තාවන් වැනි අංශ පිළිබඳව ද අවධානය යොමු කර තිබිණි.

# 2 සහශ්‍ර සංවර්ධන අරමුණු




සහශ්‍ර සමුලුව, 2000 සැප්තැම්බර් 6-8

ලෝකයේ සියලුම අංශයන්හි සමස්ත සංවර්ධනයක් ඇති කර ගැනීම සඳහා දරන ලද වැදගත් ප්‍රයත්නයක් ලෙස සහශ්‍ර සංවර්ධන අරමුණු සැලකිය හැකිය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය දරන රටවල් 191 සහ සංවර්ධන නියෝජිතායතන 22 ක් එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සමුළුවේදී සහශ්‍ර ප්‍රකාශයනට 2000 සැප්තැම්බර් මාසයේදී එකගතාවය පළ කිරීමෙන් මෙය නිල වශයෙන් ආරම්භ විය. මෙහි 2015 වසර වන විට දිනාගත යුතු අරමුණු 8 ක් සඳහන් වේ.

## 2015 වසර වන විට දිනාගත යුතු සහශ්‍ර සංවර්ධන අරමුණු 8

1. අන්ත දරිද්‍රතාවය පිටුදැකීම
2. සියලුම දෙනාට අධ්‍යාපනය ලබාදීම
3 ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ප්‍රවර්ධනය කිරීම සහ කාන්තාවන් සවිබල ගැන්වීම
4. ළමා මර්තාතාවය අඩු කිරීම
5. මාතෘ මර්ත්‍යතාවය අඩු කිරීම
6. ඒඩ්ස්, මැලේරියාව සහ අනෙකුත් රෝග තුරන් කිරීම
7. පරිසරයේ තිරසරභාවය තහවුරු කිරීම
8. සංවර්ධනය උදෙසා සහයෝගයෙන් ක්‍රියාකාරීම

මෙම අරමුණු පිළිබඳව අවධානය යොමු කිරීමේදී සහශ්‍ර සංවර්ධන අරමුණු තුළින් ප්‍රධාන අංශ 3 ක් අවධාරණය කරනු ලබන බව පෙනී යයි. ඒවා නම්,

1. මානව ප්‍රාග්ධනය
2. යටිතල පහසුකම්
3. මානව අයිතිවාසිකම් ය

මානව ප්‍රාග්ධනය යටතට මූලික වශයෙන් පෝෂණය, සෞඛ්‍ය සත්කාර හා අධ්‍යාපනය ඇතුළත් වේ.

යටිතල පහසුකම්වලට බීමට සුදුසු ජලය, බලශක්තිය, තොරතුරු තාක්ෂණය, කෘෂිකාර්මික නිෂ්පාදන වැඩිදියුණු කිරීම, ප්‍රවාහනය හා පරිසරය ඇතුළත් වන අතර

මානව අයිතිවාසිකම්වලට තිරසර භාවිතාවන් ප්‍රවර්ධනය, කාන්තාවන් සවිබල ගැන්වීම, ප්‍රචණ්ඩත්වය අවම කිරීම, පොදු සේවාවන් සඳහා සමාන ප්‍රවේශය සහතික කිරීම, දේශපාලන සහභාගිත්වය වැඩිදියුණු කිරීම ඇතුළත්ය.

පුද්ගල ධාරිතාවයන් සංවර්ධනය කරමින් ඵලදායී ජීවිතයන් ලබා ගැනීම සඳහා වූ මාධ්‍යයන් දිරිගැන්වීම මෙමගින් අපේක්ෂා කරනු ලබයි.

2000 වසරේ සිට 2015 දක්වා ක්‍රියාවට නැංවීමට එකඟත්වය පළ කරන ලද සහශ්‍ර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් සමාලෝචනය කිරීම 2012 වසරේ සිට ආරම්භවිණි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලිකත්වයෙන් සිදු කරන ලද මෙම අධ්‍යයනයන්හිදී විවිධ අරමුණු සම්බන්ධයෙන් විවිධ රටවල් එකිනෙකට වෙනස් වූ සාධන මට්ටම් වාර්තා කර තිබෙන බව හෙළිවිණි. මෙයට හේතු සාධක වූ ප්‍රධාන කරුණු වශයෙන් පහත දැක්වෙන ඒවා සැලකිය හැකිය.

- සංවර්ධනය වෙමින් පවත්නා බොහොමයක් රටවල පවත්නා අතිමහත් වෙනස්කම් නොසලකා හැරීම
- හිමිකාරිත්වය, වගකීම් දැරීම පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයන්
- නීතිමය ස්වභාවයක් නොතිබීම
- සහභාගිත්ව ප්‍රවේශයන්ට වඩා සංවර්ධන ආධාර සපයන්නන්ගේ න්‍යාය පත්‍රයන් පිළිබඳව වැඩියෙන් අවධානය යොමු කිරීම
- මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම
- දේශපාලනික වශයෙන් වූ සහයෝගය නොතිබීම

# 3 තිරසර සංවර්ධන අරමුණු

සහශ්‍ර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම පිළිබඳව අවධානය යොමු කිරීමෙන් අනතුරුව එහි පැවති දුර්වලතා සකසාගනිමින් සහ වර්තමානයේ දකින්නට ලැබෙන තත්ත්වයන් හා අනාගතයේ ඇති විය හැකි අභියෝගාත්මක තත්ත්වයන්ට මුහුණුදීම සඳහා සංවර්ධන සැලැස්මක් සැකසීමේ අවශ්‍යතාවය පැනනැගිණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත්වීම යටතේ පශ්චාත් සංවර්ධන න්‍යාය පත්‍රය හෙවත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නංවාලීමට 2015 වසරේ සැප්තැම්බර් මාසයේ දී ලෝක නායකයන් එකගත්වය පළ කරන ලදී.

තිරසර සංවර්ධන අරමුණු 17 ක් තිබෙන අතර එම අරමුණු යටතේ ඉලක්ක 169ක් දැක්වේ. මෙම අරමුණු 2030 වසර වන විට ලඟාකර ගැනීමට අපේක්ෂා කෙරේ. තිරසර සංවර්ධන අරමුණු 17 තුළින් සුවිශේෂී ක්ෂේත්‍රයන් 17 ක් අවධාරණය කරනු ලබයි. මේවාට එකිනෙකට වෙන් වූ අනන්‍යතාවයක් තිබෙන අතර එනමුත් ක්‍රියාවට නැංවීමේදී එකිනෙක අතර ඒකාබද්ධතාවයකින් යුක්තය.

සියලු දෙනාගේම සහභාගිත්වයෙන් මෙම අරමුණු ඉටුකර ගැනීම තුළින් සිදුවන සමාජ පරිණාමන ක්‍රියාවලියක් ඔස්සේ සිදුවන වඩාත් තිරසර වූ සංවර්ධනයක් අපේක්ෂා කෙරේ. මෙහිදී සියලු පාර්ශවයන් යනුවෙන් අදහස් කරන්නේ රජය, පෞද්ගලික අංශය සහ සිවිල් සමාජයයි. එබැවින් මෙහිදී මෙම පාර්ශවයන් තුනටම අදාළ වූ කාර්යභාරයන් හා වගකීම් පවතී.



# 4 තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳ හැඳින්වීමක්

1. සියලුම ස්ථානයන්හි සියලුම ස්වරූපයන්ගෙන් පවත්නා දරිද්‍රතාවය අවසන් කිරීම
2. කුසගින්න නිමා කිරීම
3. සෞඛ්‍ය යහපැවැත්ම
4. සැමට අධ්‍යාපනය
5. ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය
6. පිරිසදු ජලය හා සනීපාරක්ෂාව
7. දරාගත හැකි සහ පිරිසිදු බලශක්තිය
8. ආර්ථික වර්ධනය සහ ගෞරවාන්විත රැකියා
9. තිරසර කාර්මිකකරණය
10. රටවල් ඇතුළත සහ රටවල් අතර ඇති අසමානතාවය අඩු කිරීම
11. තිරසර නගර සහ මානව ජනාවාස
12. තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවක් ඇති කිරීම
13. දේශගුණික විපර්යාස අවම කිරීම
14. ජලයේ ජීවිත
15. මිහිමත ජීවිත
16. සැමට සාමය සහ යුක්තිය
17. පාර්ශවකරණය


1 NO POVERTY

## දරිද්‍රතාවය: සියලුම ස්ථානයන්හි සියලුම ස්වරූපයන්ගෙන් පවත්නා දරිද්‍රතාවය අවසන් කිරීම

මේ යටතේ මූලික වශයෙන් ඉලක්ක පහක් තිබෙන අතර ඒවා මගින් මූලික වශයෙන් සියලුම ස්ථානයන්හි සියලුම ස්වරූපයන්ගෙන් දක්නට ලැබෙන දරිද්‍රතාවය අවසන් කිරීමට අපේක්ෂිතය. අන්තර්ජාතික මිණුම්වලට අනුව දිනකට ඇමෙරිකානු ඩොලර් 1.25 කට වඩා අඩු ආදායමක් ලබන පුද්ගලයින් දරිද්‍රතාවයෙන් පෙළෙන පුද්ගලයින් ලෙස සැලකේ. මෙම අරමුණු යටතේ,

- ජාතික නිර්නායකයන්ට අනුකූලව දරිද්‍රතාවයෙන් පෙළෙන සියලුම කාන්තාවන්, පිරිමින් සහ ළමුන්ගේ ප්‍රමාණය 2030 වන විට අඩකින් අඩු කිරීමට අපේක්ෂා කෙරේ.
- මේ සඳහා ඒ ඒ රටවල්වලට ගැළපෙන ආකාරයට සමාජ ආරක්ෂණ පද්ධති ක්‍රියාවට නැංවීමටත් එමගින් දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි ජනතාව ප්‍රමාණවත් අන්දමින් ආවරණය කිරීමටත් යෝජනා කර තිබේ.
- එසේම සියලුදෙනාට ආර්ථික සම්පත්වලට හා මූලික සේවාවන්ට ප්‍රවේශ වීමටත්, ඉඩම් හිමිකර ගැනීමට සහ අනෙකුත් ආකාරයේ දේපළ, ස්වභාවික සම්පත් නව තාක්ෂණය හා මූල්‍ය සේවාවන්ට පිවිසීමටත්, ඒවා භාවිත කිරීමටත් අවස්ථාව ලබා දීමට බලාපොරොත්තු වේ.
- එසේම දේශගුණික වෙනස්කම්වලින් සහ අනෙකුත් සමාජ, ආර්ථික හා පරිසර සාධක මත ඇති වන්නා වූ අහිතකර තත්ත්වයන්ට සාර්ථකව මුහුණදීමට ඔවුන් තුළ ඔරොත්තු දීමේ ශක්තිය වර්ධනය කිරීමට අපේක්ෂිත ය.

ශ්‍රී ලංකාව පිළිබඳව අවධානය යොමු කළහොත් 2016 වසරේ සංඛ්‍යා ලේඛනවලට අනුව සමස්ත ජනගහනයෙන් 4.1% ජාතික දරිද්‍රතා රේඛාවට පහළින් සිටිති.




රැකියාවන්හි නියුක්ත ජනගහනයෙන් දිනකට ඩොලර් 1.9 වඩා අඩුවෙන් මිළදී ගැනීමේ ශක්තිය පවතින ප්‍රතිශතය 0.4% ක් වේ.

2 ZERO HUNGER

## කුසගින්න තුරන් කිරීම: කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාවය, ඉහළ පෝෂණයක් අත්පත් කර ගැනීම සහ තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.



ඡායාරූපය: www.business-standard.com

2030 වන විට කුඩා ළමුන් ඇතුළු දිළිඳුභාවයෙන් පෙළෙන, අවදානම් තත්ත්වයන්ගේ සිටින පුද්ගලයින්ට පෝෂණය සහ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම, වසර පුරාම ආහාර ලැබෙන බවට සහතික කිරීම සහ දේශගුණික බලපෑම් අවම කිරීම හරහා තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම මෙම අරමුණ මගින් අපේක්ෂා කෙරේ.

මෙම අරමුණ හා බැඳුනු ඉලක්ක 8ක් ඇති අතර අධික කුසගින්න, මන්දපෝෂණය සහ කෘෂිකාර්මික අස්ථායිතාවය තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමේ දී විශාල බාධාවක් නිර්මාණය කර ඇති බව පෙන්වා දෙන එක්සත් ජාතීන්ගේ සංවිධානය සිය සංඛ්‍යාලේඛන මගින් ලෝකයේ බිලියන 2ක ජනගහනයකට ආරක්ෂිත, පෝෂදායි සහ ප්‍රමාණවත් ආහාර සඳහා නිතිපතා ප්‍රවේශයක් නොමැති බව පෙන්වා දෙයි. එමෙන්ම වයස අවුරුදු පහට අඩු ළමයින්ගෙන් 21.3% (මිලියන 144) අධික සාගින්නෙන් පසු වේ. සුරක්ෂිත, පෝෂ්‍යදායි ආහාර සඳහා නිතිපතා ප්‍රවේශය නොමැති වීම, අධික සාගින්න සහ කෘෂිකාර්මික අස්ථායිතාවය සඳහා මිනිසුන් විසින් නිර්මාණය කරගෙන තිබෙන ගැටුම්, දේශගුණික විපර්යාස සහ ආර්ථික පසුබෑම් සෘජුවම හේතුවන බව පෙනේ. ඉඩම්, අනෙකුත් ඵලදායි සම්පත්, දැනුම, මූල්‍ය සේවාවන්, කෘෂිකාර්මික නොවන අංශවල සේවාවන් සඳහා ආරක්ෂිත සහ සමාන ප්‍රවේශය ලබා දෙමින් සුළු පරිමාන ආහාර නිෂ්පාදකයින්ගේ, කාන්තාවන්ගේ, ස්වදේශිකයින්ගේ, ගෙවතු වගාකරුවන්ගේ, ගැමියන්ගේ සහ ධීවරයින්ගේ ආදායම් සහ කෘෂිකාර්මික ඵලදායිතාවය 2030 වන විට දෙගුණ කිරීම යනාදී ඉලක්ක මේ අතර වේ. ඉහත ඉලක්කයන් ජයගැනීම සඳහා කුඩා ළමයින්, කාන්තාවන්, වයස්ගත පුද්ගලයින්, මව්වරුන් සහ අවදානම් තත්ත්වයේ පසුවන ප්‍රජාවන් ඉලක්ක කරගත් සමාජීය වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම හරහා කුසගින්න සහ මන්දපෝෂණය දුරු කිරීමටත්, කෘෂිකාර්මික ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම සහ කෘෂිකර්මාන්තය සඳහා කාන්තාවන්ට සහ පිරිමින්ට සමාන ප්‍රවේශය සහතික කිරීම තුළින් ගංවතුර, නියගය වැනි ස්වාභාවික විපත් මගින් කෘෂිකර්මාන්තයට සිදුවන හානි අවමකර තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කර ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීමටත් හැකි වේ.

3 GOOD HEALTH AND WELL-BEING

## සෞඛ්‍ය යහපැවැත්ම: සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් තහවුරු කිරීම සහ සියල්ලන්ටම සෑම වයසකදීම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම



ඡායාරූපය: Raghavendra V. Konkathi

මේ යටතේ මූලික වශයෙන් ඉලක්ක 13ක් ඇති අතර සෑම වයසකම පසුවන සියලුම දෙනාට සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා මාතෘ සහ ළමා මරණ අවම කිරීම, ප්‍රතිශක්තීකරණ ආවරණය පුළුල් කිරීම සහ සමහර බෝ නොවන රෝග අවම කිරීම වැනි අංශ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සෞඛ්‍ය ක්ෂේත්‍රවල ප්‍රගතිය අඛණ්ඩව වර්ධනය කිරීමට සියලුම රාජ්‍යයන් මෙම අරමුණ යටතේ බැඳී සිටියි. නීරෝගී ආර්ථිකයක පදනම සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් වන නමුත් සංවර්ධනය නොවූ සහ සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල ඉල්ලුමට සාපේක්ෂව ප්‍රමාණවත් සෞඛ්‍ය සේවාවන් නොමැති වීම, වෛද්‍ය සැපයුම් සහ සෞඛ්‍ය සේවකයින් නොමැති වීම වැනි බොහෝ අභියෝග සෞඛ්‍ය පද්ධතීන් තුළ පවතී. ලෝකයේ රටවල්වලින් 40%ක පුද්ගලයින් දස දහසකට වෛද්‍යවරුන් සිටින්නේ 10කටත් අඩු ප්‍රමාණයකි. ගෝලීය වශයෙන් මිලියන 38ක් ජනගහනය HIV රෝගයෙන් පෙළේ. 2019 වර්ෂයේ ආරම්භ වූ COVID-19 වසංගත තත්ත්වයත් සමග සියලුම රටවල සෞඛ්‍ය පද්ධතීන් මෙතෙක් අත්පත් කරගෙන තිබෙන ධනාත්මක ප්‍රගතියට බාධා එල්ල වී තිබේ.

මැලේරියාව සහ ක්ෂය රෝගය වැනි ඇතැම් බෝවන රෝග (ඉලක්ක 3.3) මෙන්ම ළමා හා මාතෘ මරණ සංඛ්‍යාව අවම කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරිත්වය කැපී පෙනේ. නමුත් පිළිකා, වකුගඩු රෝග, අධි රුධිර පීඩනය සහ හෘද රෝග වැනි නිදන්ගත බෝනොවන රෝගවල වර්ධනයක් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතියට සැලකිය යුතු බරක් වී තිබේ. 2001 දී ශ්‍රී ලංකාවේ සිදු වූ සම්පූර්ණ මරණ සංඛ්‍යාවෙන් 71% බෝ නොවන නිදන්ගත රෝග හේතුවෙන් සිදුව ඇති අතර, අනතුරු හේතුවෙන් 18% ක් ද, බෝවෙන රෝග සහ මාතෘ හා පූර්ව ප්‍රසූති හේතූන් නිසා 11% ක් ද සිදුවී ඇත. ජාතික උපායමාර්ගවලට සහ අධ්‍යාපන විෂයමාලා තුළට ප්‍රජනන සෞඛ්‍ය, පවුල් සැලසුම් ඇතුළත් කිරීම තුළින් සෞඛ්‍ය පද්ධතියේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමටත්, බෝ නොවන රෝග සහ HIV වැනි වසංගත රෝග නිවාරණය, සියලු දෙනා හට සෞඛ්‍ය සේවා සහ එන්නත්කරණය සඳහා ප්‍රවේශය සහතික කිරීම, තාක්ෂණික දැනුම ගෝලීය වශයෙන් හුවමාරු කර ගැනීම හරහා සෑම වයසකම පසුවන සියළු දෙනාට සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ යහපැවැත්ම තහවුරු කිරීම කළ හැකිය.

![SDG 4 Quality Education icon]

4 QUALITY EDUCATION

## සැමට අධ්‍යාපනය: සියලු දෙනාට සමානාත්මතාවයෙන් යුතු ගුණාත්මක අධ්‍යාපනයක් සහ යාවජීව අධ්‍යාපන අවස්ථා සහතික කිරීම



ඡායාරූපය: Asian Development Bank

ඵලදායී හා අර්ථාන්විත ඉගෙනීමේ ප්‍රතිඵල කරා යොමු වූ ගුණාත්මක ප්‍රාථමික හා ද්වීතියික අධ්‍යාපනය සෑම ගැහැනු පිරිමි දරුවකුටම නොමිලේ සහ සාධාරණව ලබාදීම සහතික කිරීම, ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටීම පිණිස ඔවුන්ට ගුණාත්මක මුල් ළමාවිය සංවර්ධන කුසලතාවන් තුළින් පෙර පාසල් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා තිබීම තහවුරු කිරීම, සෑම කාන්තාවකටම සහ පිරිමියෙකුටම දරාගත හැකි මට්ටමේ සහ ගුණාත්මක විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඇතුළු තාක්ෂණ, වෘත්තීය සහ තෘතියීය අධ්‍යාපනයට සමාන ප්‍රවේශ අවස්ථා ලබාදීම සහතික කිරීම, ජීවනෝපාය සඳහා හෝ ගෞරවාන්විත වෘත්තියකට සහ ව්‍යවසායකත්වයට අදාළ තාක්ෂණික, වෘත්තීය දක්ෂතාවලින් යුත් තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු ප්‍රමාණයක් වැඩිකිරීම, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ස්වදේශීයන් සහ අවදානම් තත්ත්වයන් තුළ සිටින දරුවන් ඇතුළු සීමාවන්ට ලක් වී ඇති අය සඳහා අධ්‍යාපනයේ සියලුම මට්ටම් සහ වෘත්තීය පුහුණුවට සමාන අවස්ථා සහතික කිරීම සහ අධ්‍යපනයේදී ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත වූ විෂමතාවන් තුරන් කිරීම, සියලු තරුණයින් සහ ස්ත්‍රීපුරුෂ දෙපාර්ශවයේම වැඩිහිටියන් සැලකිය යුතු ප්‍රමාණයක් සාක්ෂරතාව සහ අංක භාවිත හැකියාව ලබාගැනීම සහතික කිරීම, ගෝලීය පුරවැසිභාවය ප්‍රවර්ධනය කිරීම ඇතුළු ඉලක්ක හතක් සහ ඒ හා බැඳුනු අනු ඉලක්ක තුනක් මෙම අරමුණ හා බැඳී පවතී.

2018 වසර වන විටදීත් ලෝකයේ ළමුන්ගෙන් මිලියන 260ක් පමණ පාසල් අධ්‍යාපනයෙන් බැහැරව සිටීමත් ලෝකයේ ළමයින් සහ නව යෞවනයන්ගෙන් හරි අඩක් කියවීම, ලිවීම සහ අංක ගණිතය පිළිබඳව අවම ප්‍රමිතීන්වත් සපුරා නොතිබීමත් තුළ 2030 වසරේ තිරසර අධ්‍යාපන අරමුණ ජයගැනීම සඳහා සියලුම රාජ්‍යයන් වැඩි අවධානයක් යොමු කළ යුතු බව පෙනේ. මෙවැනි ගෝලීය තත්ත්වයක් තුළ 2019 වසරේ ආරම්භ වූ COVID-19 වසංගතය හේතුවෙන් ලෝකයේ 90%ක් ළමයින්ගේ අධ්‍යාපනයට බලපෑම් ඇති වී තිබෙන අතර අවම වශයෙන් ළමයින් මිලියන 500කට පමණ දුරස්ථ අධ්‍යාපනය සඳහා ප්‍රවේශය නොමැති බව එක්සත් ජාතීන්ගේ සංවිධානය පෙන්වා දේ.

දළ ජාතික නිෂ්පාදිතයෙන් අධ්‍යාපනය සඳහා වෙන්කරන මුදල් ප්‍රමාණය වැඩි කිරීම, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය, පුහුණු ගුරුවරුන්ගේ ප්‍රතිශතය ඉහළ නැංවීම සහ සියල්ලන්ට අධ්‍යාපනයට ඇති ප්‍රවේශය සහතික කිරීම හරහා තිරසර අධ්‍යාපන අරමුණ ජයගැනීම සඳහා ලෝකයේ රටවල්වලට ක්‍රියාකළ හැකිය.

5 GENDER EQUALITY

# ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය



ඡායාරූපය: Lakshman Nadaraja/World Bank

ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය ඇති කිරීම සහතික කිරීම සහ සියලුම ගැහැනු ළමුන් හා කාන්තාවන් බලගැන්වීම මෙම අරමුණ යටතේ අපේක්ෂා කරයි. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය මූලික මානව අයිතිවාසිකමක් පමණක් නොව සාමකාමී, සමෘද්ධිමත් හා තිරසර ලෝකයක් සඳහා අත්‍යවශ්‍ය පදනමක් වේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය ඇති කිරීමේ අවාසි සහගත තත්ත්වයන් සහ අභියෝග ලෝකයේ බොහෝ රටවල දක්නට ලැබේ. වෙනස් කොට සැලකීමේ නීති සහ සමාජ සම්මතයන් බහුලව පවතී. දේශපාලන නායකත්වයේ සෑම තරාතිරමකම කාන්තාවන් අඩුවෙන් නියෝජනය වන අතර වයස අවුරුදු 15ත් 49ත් අතර කාන්තාවන් සහ ගැහැනු ළමයින් 5න් 1ක් ශාරීරික හෝ ලිංගික හිංසනය අත්විඳින බව වාර්තා වේ. රටවල් 39ක ගැහැනු දරුවන්ට සහ පිරිමි දරුවන්ට දේපළ සඳහා සමාන උරුමයක් නොමැති අතර රටවල් 49ක් ගෘහස්ථ හිංසනයෙන් කාන්තාවන් ආරක්ෂා කිරීමේ නීති සම්පාදනය කර නොමැත.

ශ්‍රී ලංකාවේ 2014 වන විට පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය 5.8% ක සහ පළාත් පාලන ආයතනවල 2% කටත් අඩු අගයක් විය. මේ හරහා කාන්තාවට දේශපාලන නායකත්වය සහ තීරණ ගැනීමට තවමත් ඇත්තේ සීමිත අවකාශයක් බව පෙනේ. ජාතික අයවැය සකස් කිරීමේදී පවා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී අයවැය සැකසීම තවමත් මන්දගාමී තත්ත්වයක ඇත. සියලුම කාන්තාවන්ට හා ගැහැනු දරුවන්ට සියලුම ආකාරයේ පවත්නා වෙනස්කොට සැලකීම් නවතා දැමීම, නිවසේදී කාන්තාවන්ගේ කටයුතු සඳහා වටිනාකමක් ලබාදීම, ජාවාරම්, විවිධ සූරාකෑම් සහ අතවරවලට ලක්වීම ඇතුළු පොදු සහ පෞද්ගලික අවකාශයන් තුළ කාන්තාවට සහ ගැහැනු ළමයින්ට සිදුවන ලිංගික හිංසන නවතා දැමීම, දේශපාලනය, ආර්ථික හා පොදු ජීවිතයේ තීරණ ගැනීම සඳහා සෑම තරාතිරමකම පසුවන කාන්තාවන්ගේ පූර්ණ හා ඵලදායී සහභාගීත්වය සහ නායකත්වයට සමාන අවස්ථා සහතික කිරීම, ස්ත්‍රීපුරුෂ සමානාත්මතාවය සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රචලිත කිරීම, ප්‍රජනන සෞඛ්‍ය සහ ප්‍රජනන අයිතීන් සුරැකීම සඳහා සියලුම කාන්තාවන්ට ගෝලීය ප්‍රවේශය සහතික කිරීම ඇතුළු ඉලක්ක සහ අනු ඉලක්ක 9කින් මෙම අරමුණ සමන්විත වේ.

**6 CLEAN WATER AND SANITATION**

# පිරිසදු ජලය හා සනීපාරක්ෂාව: සැමටම පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව ලබාදීම තහවුරු කිරීම හා එහි තිරසර කළමනාකාරිත්වය


ඡායාරූපය: kansarmensrilankafoundation

ජලය, සනීපාරක්ෂාව සහ ස්වස්ථතාවය සඳහා ප්‍රවේශය මානව අයිතිවාසිකමක් වන නමුත් ජලය සඳහා ඇති ඉල්ලුම ජනගහන වර්ධනය ඉක්මවා ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ලෝක ජනගහනයෙන් අඩක් දැනටමත් අවම වශයෙන් වසරකට මාසයක්වත් දැඩි ජල හිඟයක් අත්විඳිමින් සිටියි. ජලය යහපත් සෞඛ්‍යයකට පමණක් නොව දරිද්‍රතාවය අවම කිරීම, ආහාර සුරක්ෂිතතාවය, සාමය සහ මානව හිමිකම්, පරිසර පද්ධතිය සුරැකීම සහ අධ්‍යාපනය සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන බැවින් 2030 වසර වනවිට සියලු දෙනාට පිරිසිදු ජලය, සනීපාරක්ෂාව සඳහා ප්‍රවේශය සහතික කිරීම මෙම අරමුණ මගින් බලාපොරොත්තු වේ. එසේ වුවද රටවල් ජල හිඟය, ජල දූෂණය, ජලය ආශ්‍රිත පරිසර පද්ධති හා අන්තර් දේශසීමා ජල දෝණිවල සහයෝගීතාව හා බැඳී පවතින අභියෝගයන්ට මුහුණ දෙයි. COVID-19 වසංගතය ද රෝග වැළැක්වීම සඳහා සනීපාරක්ෂාව, ස්වාස්ථ්‍යතාවය සහ පිරිසිදු ජලය සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක තීරණාත්මක වැදගත්කම පෙන්වා දී ඇත. සියලු දෙනාටම ආරක්ෂිත, පිරිසිදු පානීය ජලය සඳහා සමාන සහ සාධාරණ ප්‍රවේශය සහතික කිරීම, දූෂණය අවම කිරීම, රසායනික ද්‍රව්‍ය සහ පිරිපහදු නොකළ අප ද්‍රව්‍ය ජල ප්‍රභව වෙත මුදා හැරීම අවම කිරීම සහ ජලය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ප්‍රතිශතය ඉහළ නැංවීම හරහා ජලයේ ගුණාත්මක භාවිතය වැඩිදියුණු කිරීම, තිරසර ජලය ලබාගැනීම් හා මිරිදිය සැපයුම් මගින් සියලුම අංශවල ජල භාවිතයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම තුළින් ජල හිඟයට විසඳුම් සෙවීම සහ එමගින් ජල හිඟයෙන් පීඩා විඳින පිරිස අවම කරගැනීම, 2030 වනවිට ජලය සමග බැඳී පවතින පරිසර පද්ධති වන ගංගා, වැව්, කඳු, වනාන්තර, තෙත්බිම් හා වගුරු බිම් ආරක්ෂා කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම ඇතුළු ඉලක්ක 8 ක් මේ අරමුණ සමග බැඳී පවතී.

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 92% සනීපාරක්ෂාව සඳහාත් 94% ක් පිරිසිදු ජලය සඳහා ප්‍රවේශය සහතික කර ඇතත් පාසල්වල පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂාව සඳහා ඇති ප්‍රවේශය ඉතා අවම මට්ටමක පවතින බව පෙනේ. මධ්‍යම පළාතේ පාසල් 403 කට පිරිසිදු පානිය ජලය සඳහා ප්‍රවේශය නොමැත. එමෙන්ම ශ්‍රී ලංකාවේ පාසල් අතරින් පාසල් 1860කට පිරිසිදු පානීය ජලය සඳහා ප්‍රවේශය නොමැත. ශ්‍රී ලංකාවේ පානීය ජලය සඳහා ප්‍රධාන වගකීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හිමිවන අතර සෞඛ්‍ය අමාත්‍යාංශය සනීපාරක්ෂාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන්වලට නායකත්වය ලබා දේ.

7 AFFORDABLE AND CLEAN ENERGY

## **දරාගත හැකි සහ පිරිසිදු බලශක්තිය:** දරාගත හැකි වූ විශ්වාසනීය, තිරසර සහ නූතන බලශක්තිය සඳහා ප්‍රවේශය සැමට තහවුරු කිරීම



ඡායාරූපය: windforce.lk


ලබාගත හැකි විශ්වාසනීය නවීන බලශක්ති සේවාවන් සඳහා ගෝලීය ප්‍රවේශයන් සහතික කිරීම මෙම අරමුණ යටතේ අපේක්ෂා කෙරේ. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ දී ලෝකයේ රටවල් වැඩි ප්‍රගතියක් ලබා ඇති අතර 2015 න් පසු දුප්පත් රටවල විදුලිය සඳහා ප්‍රවේශය වේගවත් වීම, බලශක්ති කාර්යක්ෂමතාව අඛණ්ඩව වැඩිදියුණු වීම පුනර්ජනනීය බලශක්තිය විදුලිබල ක්ෂේත්‍රයේ ආකර්ෂණීය වාසි ලබා ගැනීම දක්නට ලැබේ. නමුත් ගෝලීය ජනගහනයෙන් සියයට 13කට තවමත් නවීන විදුලිය සඳහා ප්‍රවේශය නොමැත. දශක ගණනාවක් තිස්සේ ගල් අගුරු, ගෑස් වැනි පොසිල ඉන්ධන බලශක්තියේ ප්‍රධාන ප්‍රභවයන් වූ නමුත් කාබන් ඉන්ධන දහනය කිරීම හේතුවෙන් දේශගුණික විපර්යාසයන්ට හේතු වන හරිතාගාර වායූන් විශාල ප්‍රමාණයක් නිපදවීම හරහා ජනතාවගේ යහපැවැත්මට හා පරිසරයට අහිතකර බලපෑම් ඇති කර තිබේ. ඒ අනුව ගෝලීය බලශක්ති පරිභෝජනය සඳහා සුළං බලය, හිරු එළිය වැනි  පුනර්ජනනය වන බලශක්ති ප්‍රභවයන් වෙත ප්‍රවේශය 2030 වන විට සපුරා නොගන්නේ නම් ලෝක ජනගහනයෙන් තුනෙන් එකක් පමණ එනම් වැඩි වශයෙන් කාන්තාවන් සහ ළමුන් හානිකර ගෘහස්ථ වායු දූෂණයට නිරාවරණය වනු ඇත. දරාගත හැකි මිලට නවීන බලශක්තිය සඳහා ප්‍රවේශය සියලුදෙනාට සහතික කිරීම, ගෝලීය බලශක්ති මිශ්‍රණයට පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සැළකිය යුතු මට්ටමින් වැඩි කිරීම, බලශක්තිවල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ වේගය 2030 වන විට දෙගුණයකින් වැඩි කිරීම, බලශක්ති කාර්යක්ෂම භාවිතය සහ ආරක්ෂා කිරීම පිළිබඳව දැනුම ප්‍රචලිත කිරීම ඇතුළු ඉලක්ක පහක් සාක්ෂාත් කර ගැනීම මෙම අරමුණ යටතේ ලෝකයේ සියලුම රටවල් බැඳී සිටියි.



8 DECENT WORK AND ECONOMIC GROWTH

# ආර්ථික වර්ධනය සහ ගෞරවාන්විත රැකියා

සියලුදෙනා අන්තර්කරණය වූ තිරසර ආර්ථිකයක් වර්ධනය කිරීම, ඵලදායි රැකියා අවස්ථාවන් සහ සැමට ගෞරවාන්විත වෘත්තියක් ලැබීම ප්‍රවර්ධනය කිරීම මෙම අරමුණ යටතේ අපේක්ෂා කරයි. ගෞරවාන්විත රැකියා යනු ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සියලුදෙනාටම ඵලදායී, සාධාරණ ආදායමකට හිමිකම් කියන, රැකියා ස්ථානයේ ආරක්ෂාව සහ පවුල් සඳහා සමාජ ආරක්ෂාව සලසන, පුද්ගලික සංවර්ධනය සඳහා වඩා හොඳ අපේක්ෂාවන් සහ සමාජ ඒකාබද්ධතාවය සලසන රැකියාවන් වේ. මෙම අරමුණ යටතේ ඉලක්ක 12ක් ඇති අතර සංවර්ධනය නොවූ රටවල දේශීය නිෂ්පාදන වර්ධනවේගය 7% මට්ටමක පවත්වාගෙන යාම, ඒක පුද්ගල ආර්ථික වර්ධන වේගය යහපත්ව පවත්වාගෙන යාම, විවිධාංගීකරණය, නවීන තාක්ෂණය, නවෝත්පාදන හරහා ආර්ථිකයේ උසස් ඵලදායි මට්ටමක් කරා ළඟා වීම, ශ්‍රම සූරා කෑම, මිනිස් ජාවාරාම, ළමා සොල්දාදුවන් බඳවා ගැනීම තහනම් කිරීම සඳහා ක්ෂණික සහ ඵලදායි පියවර ගැනීම, සියලුම ආකාරවලින් පවත්නා ළමා ශ්‍රමය අවසන් කිරීම, සැමට බැංකු, රක්ෂණ සහ මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය දිරිගැන්වීම සහ පුළුල් කිරීම සඳහා දේශීය මූල්‍ය ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම ඇතුළු ඉලක්ක ගණනාවක් මෙම අරමුණ යටතේ සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරයි. ගෝලීය පවත්නා තත්ත්වය පිළිබඳව සලකා බැලීමේදී 2018 වසර අවසානයේදී ගෝලීය ආර්ථික වර්ධන වේගය 2.0%ක් විය. 2019 වසරේ කොවිඩ් වසංගතය ආරම්භ වීමත් සමගම මූල්‍ය වෙළඳ පොළ අස්ථාවරත්වය ඇති කරමින් ආර්ථිකයට ඇති කළ දැඩි කම්පනයෙහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය ආර්ථික වර්ධනයෙහි වේගය 1.5% දක්වා පහළ ගොස් ඇත. 2019 වසරේදී කොවිඩ් වසංගතය හේතුවෙන් ලෝකයේ තරුණ තරුණියන්ගෙන් 22% කට අධ්‍යාපනය, රැකියා අවස්ථාවන් හෝ පුහුණුව යන අංශවල ප්‍රවේශය අහිමි වී ඇත. එමෙන්ම ගෝලීය වශයෙන් පවත්නා ස්ත්‍රීපුරුෂ වැටුප් පරතරය 23%ක් වන අතර 2030 වසර වන විට තීරණාත්මක ක්‍රියාමාර්ගයක් නොගතහොත් ස්ත්‍රීන්ට සහ පුරුෂයින්ට සමාන වැටුප් ලබා ගැනීමට තවත් වසර 68ක් ගතවනු ඇත.




විවිධාංගීකරණය වූ, තිරසර, නවෝත්පාදන හා ජනතාව කේන්ද්‍ර කරගත් ආර්ථිකයන් ගොඩනැගීම, තරුණ රැකියා ප්‍රවර්ධනය කිරීම සහ කාන්තාවන්ගේ ආර්ථික සවිබල ගැන්වීම, අධ්‍යාපනය සඳහා ආයෝජනය කිරීම, ශ්‍රම වෙළඳපොළ ඉල්ලුමට සරිලන රැකියා පුහුණු අවස්ථා ඇති කිරීම සහ එහි ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා සියලුම රජයන් කටයුතු කිරීම හරහා මෙම අරමුණ සාක්ෂාත් කරගත් හැකිය.

2020 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය -3.6% මට්ටමේ පැවතී අතර රැකියා වියුක්ති අනුපාතය 5.5% දක්වා ඉහළ ගියේය. COVID-19 වසංගත තත්ත්වයෙන් ආර්ථිකයට එල්ල කළ දැඩි බලපෑම එයට හේතු විය.

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

# තිරසර කාර්මිකකරණයට ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැඟීම, තිරසර කාර්මිකකරණය සහ නව්‍යකරණයන් ප්‍රවර්ධනය කිරීම

පරිසරයට ධනාත්මක බලපෑමක් ඇති කරන ප්‍රවේශයක් ලෙස මෙම ප්‍රවේශය හැඳින්විය හැකිය. සැමට දැරිය හැකි සහ සාධාරණ ප්‍රවේශයක් කෙරෙහි අවධානය යොමු කරමින් ආර්ථික සංවර්ධනයට සහ මානව යහපැවැත්මට සහාය වීම සඳහා ගුණාත්මක, විශ්වසනීය, තිරසර හා ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙම අරමුණ යටතේ අපේක්ෂා කරයි. ඒ අනුව අවශ්‍යතාවයන් මත තාක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ සිදුකිරීම හා ඒ සඳහා සම්පත් වෙන් කිරීම සුළුපරිමාණ කර්මාන්තවල දියුණුව සඳහා ණය පහසුකම් හා තාක්‍ෂණික සහය ලබාදිම සියලු දෙනාටම අන්තර්ජාලය හා නව තාක්ෂණයට ප්‍රවේශ වීමට අවස්ථාවන් ඇතිකිරීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට ප්‍රවේශය සැලකිය යුතු ලෙස වැඩි කිරීම සහ අවම වශයෙන් අන්තර්ජාලයට විශ්වීය හා දැරිය හැකි ප්‍රවේශයක් ලබා දීමට උත්සාහ කිරීම ඇතුළු ඉලක්ක අටකින් මෙම අරමුණ සමන්විත වේ. අවම සංවර්ධිත රටවල්, විශේෂයෙන්, 2030 මෙම අරමුණ සපුරා ගැනීමට නම් ඔවුන්ගේ නිෂ්පාදන අංශයේ සංවර්ධනය වේගවත් කළ යුතු අතර විද්‍යාත්මක පර්යේෂණ හා නවෝත්පාදන සඳහා ආයෝජන ඉහළ නැංවිය යුතුය. කෙසේ නමුත් COVID-19 වසංගත තත්ත්වය නිෂ්පාදන කර්මාන්තවලට දැඩි ලෙස අභියෝග එල්ල කර ඇති අතර ගෝලීය වටිනාකම් දාමයන් හා නිෂ්පාදන සැපයුම කඩාකප්පල් කර ඇත. COVID-19 අර්බුදයේ උග්‍ර අවධිය අවසන් වූ පසු, ආර්ථික ප්‍රකෘතිය වේගවත් කිරීම, රැකියා උත්පාදනය, දරිද්‍රතාවය අවම කිරීම සහ ඵලදායී ආයෝජන උත්තේජනය කිරීම සඳහා රජයන්ට වෙන කවරදාටත් වඩා යටිතල පහසුකම් සඳහා ආයෝජන කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදීම අවශ්‍ය වේ. මෙම තිරසර සංවර්ධන අරමුණු ජයගැනීම සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.5ක් පමණ ආයෝජනය කළ යුතු බවත්, ඒ සමගම ගෝලීය උෂ්ණත්වය සෙල්සියස් අංශක 2 කට නොවැඩි සීමාවක පවත්වාගෙන යායුතු බවත් ගණන් බලා තිබේ.

ශ්‍රී ලංකාව COVID-19 වසංගතයේ බලපෑම සමග ආර්ථිකයේ දරුණුතම අවපාතය භුක්තිවිඳිමින් සිටියි. 2018 වසරට සාපේක්ෂව 2019 දී ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණීම 18%කින් අඩු වී ඇත. පැවති දැඩි අහිතකර කාලගුණ තත්වයන් 2019 දී කෘෂිකර්මාන්තයට බලපෑ අතර තේ, රබර්, කරදිය ධීවර් කර්මාන්තය, කරදිය ජලජ ජීවි වගා උප අංශය, වන වගාව, වනාන්තර හා දැව ආශ්‍රිත නිෂ්පාදනවල සැලකිය යුතු අඩුවක් වාර්තා වී තිබේ.



10 REDUCED INEQUALITIES

# රටවල් ඇතුළත සහ රටවල් අතර ඇති අසමානතාවය අඩු කිරීම



ඡායාරූපය: Duy Pham

2030 වන විට වයස, ස්ත්‍රීපුරුෂභාවය, ආබාධිතභාවය, ජාතිය, ජනවාර්ගිකත්වය, ආගම, ආර්ථික හෝ වෙනත් තත්ත්වයන් නොසලකා සියලු දෙනාගේ සමාජ, ආර්ථික හා දේශපාලනික ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම සහ රටවල් අතර පවතින අසමානතාවය දුරු කිරීම මෙම අරමුණ තුළින් අපේක්ෂා කරයි. රටවල් ඇතුළත සහ රටවල් අතර පවත්නා පැහැදිලිව පෙනෙන අසමානතාවය සහ අසමාන සංවර්ධනය තිරසර සංවර්ධන අරමුණු අතරට මෙම අරමුණ අන්තර්ගත කිරීමට හේතු වී තිබේ. සංවර්ධනය වෙමින් පවතින රටවලින් ලැබෙන සාක්ෂිවලින් පෙනී යන්නේ දුප්පත් ජනගහනයෙන් 20%ක දරුවන් ඔවුන්ගේ පස්වන උපන්දිනය ලැබීමට පෙර මියයාම ධනවත් පවුල්වල දරුවන්ට වඩා තුන් ගුණයකින් වැඩි බවයි. බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල මාතෘ මරණ අනුපාතය සමස්ත වශයෙන් පහත වැටී තිබියදීත් ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන් දරු ප්‍රසූතියේදී මියයාම නාගරික ප්‍රදේශවල ජීවත්වන කාන්තාවන්ට වඩා තුන් ගුණයකින් වැඩි ය. වෙනස් කොට සැලකීමේ නීති ප්‍රතිපත්ති සහ භාවිතයන් ඉවත් කිරීම සහ මේ සම්බන්ධයෙන් සුදුසු නීති සම්පාදනය, ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම ඇතුළුව සමාන අවස්ථා සහතික කිරීම, රාජ්‍ය මූල්‍ය, වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති අනුගමනය කර සමානාත්මතාවය සහතික කිරීම, සීඝ්‍ර සහ තිරසර ආර්ථික වර්ධනයක් කරා යාමට අවශ්‍ය සහය ලබාගැනීමට දුප්පත් රටවල් සඳහා සහාය ලබාදීම, එක් රටක ජීවත් වන පුද්ගලයින්ට තවත් රටක ජීවත් වන පුද්ගලයින්ගෙන් ප්‍රතිලාබ ලබාගැනීමට හා ඔවුන්ව ආරක්ෂා කිරිමට නීති නිර්මාණය කිරීම ඇතුළු ඉලක්ක 10කින් මෙම අරමුණ සමන්විත වේ.

11 SUSTAINABLE CITIES AND COMMUNITIES

# තිරසර නගර සහ මානව ජනාවාසඃ අන්තර්කරණය වූ, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසර නගර සහ මානව ජනාවාස ඇති කිරීම

තිරසර නගර සහ ප්‍රජාවන් බිහි කිරීම ඉලක්ක කරගෙන සකස් කරන ලද මෙම තිරසර සංවර්ධන අරමුණ ඉලක්ක 10කින් සමන්විත වේ. නගර සහ නාගරික ප්‍රදේශ ආර්ථික වර්ධනයේ බලවේගය වන අතර එය ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයට 60%ක් පමණ දායකතත්වයක් සලසයි. කෙසේ වෙතත් ගෝලීය කාබන් විමෝචනයෙන් 70%ක් සහ සම්පත් පරිභෝජනයෙන් 60%කට වැඩි ප්‍රමාණයක් නගර සහ නාගරික ප්‍රදේශ ආශ්‍රිතව සිදුවේ. මානව වර්ගයාගෙන් අඩක් එනම් බිලියන 3.5ක ජනතාවක් අද නගරවල ජීවත් වන අතර බිලියන 5ක ජනතාවක් 2030 වන විට නගරවල වාසය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉන් මිලියන 828ක ජනතාවක් ජීවත් වන්නේ මුඩුක්කු නිවාසවල වන අතර ඔවුන්ගෙන් වැඩි දෙනෙක් නැගෙනහිර හා ගිණිකොනදිග ආසියාවේ දක්නට ලැබේ. මෙලෙස අධික නාගරීකරණය සහ සැලසුම් රහිත නාගරික ව්‍යාප්තියෙහි සිදුවන වර්ධනය හේතුවෙන් මුඩුක්කු ජනාවාස සහ ජනගහනය ඉහළ යාම, දැරිය නොහැකි ලෙස කැලිකසල සහ අපද්‍රව්‍ය එකතු වීම හේතුවෙන් ජලය සහ සනීපාරක්ෂක පද්ධතීන් අඩපණ වීම, මාර්ග හා ප්‍රවාහනය ආශ්‍රිත ගැටලු, අධික ලෙස වායු සහ පරිසර දූෂණය, සෞඛ්‍ය ගැටලු ඇතිවීම වැනි හේතු මත ජනතාවගේ ජීවන තත්ත්වය කෙරෙහි බලපාන අවම ප්‍රමිතීන් ඔවුන්ට අහිමි වීම වැනි තත්ත්වයන් දැකිය හැකිය.

ඒ අනුව තිරසර නාගරීකරණය සහ මානව ජනාවාස ඇති කිරීමට ක්‍රියා කිරීමෙන් උත්සාහ කරන්නේ ලෝකයේ ජීවත් වන සියලු පුරවැසියන්ට යහපත් ජීවන තත්ත්වයක් ලබාදෙන නගර නිර්මාණය කිරීම සහ පරිසරයට හානියක් නොවන පරිදි මානවයා සහ පරිසරය යන දෙපාර්ශවය අතර සමෘද්ධිය සහ සමාජ ස්ථාවරත්වය ඇති කිරීමයි. හරිත නාගරික පසුබිමක් තුළ කාන්තාවන්, ළමයින්, ආබාධිත ප්‍රජාව සහ වැඩිහිටියන් ඇතුළු සියලුදෙනාටම ප්‍රමාණවත්, ආරක්ෂිත, තිරසර හා දැරිය හැකි නිවාස, ප්‍රවාහන හා මූලික සේවාවන් සඳහා ප්‍රවේශය සහතික කිරීම, නගරවල අපද්‍රව්‍ය කළමනාකරණය, වාතයේ ගුණාත්මකභාවය, නාගරික සැලසුම්කරණය සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ඒවායේ අහිතකර පාරිසරික බලපෑම අවම කිරීම සහ ආපදාවන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම, ලෝකයේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීමට සහ ආරක්ෂා කිරීමට ගන්නා උත්සාහයන් ශක්තිමත් කිරීම ඇතුළු ඉලක්ක 10ක් කෙරෙහි මෙම අරමුණ යටතේ අවධානය යොමුකරයි.

රටේ ජනගහනයෙන් 30% ක් වාසය කරන කොළඹ නගරයේ පමණක් ජීවත් වන මුඩුක්කු වාසීන්ගේ සංඛ්‍යාව 65,000 ක් (2014, UN Habitant) වන අතර කොළඹ නාගරික දුප්පත් කුටුම්භවලින් 70% ක්ම නීති විරෝධී ලෙස ඉඩම් අත්පත් කර ගැනීමෙන් අවිධිමත් ජනාවාස සාදාගෙන තිබේ. ඒ අනුව කොළඹ වැසියන්ගෙන් අඩක් පදිංචිව සිටින්නේ නීති විරෝධී ජනාවාසවල හෝ මිනිස් වාසයට නුසුදුසු යැයි නම් කරන ලද නිවාසවල බව විශ්වාස කෙරේ. පවුල්වලින් 30% කට පානීය ජලය සඳහා නිසි ප්‍රවේශයක් නොමැති අතර නගරයේ නල ජල සැපයුම මගින් ආවරණය කරන්නේ අඩු ආදායම්ලාභී නාගරික ප්‍රදේශවලින් 56% ක් පමණි.

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

# තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටාවක් ඇති කිරීම



ඡායාරූපය: Marcell Viragh

තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවක් ඇති කිරීම යන්නෙන් අදහස් කරන්නේ සම්පත් යහභාවිතය, බලශක්ති කාර්යක්ෂමතාවය ඇති කිරීම, තිරසාර යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ මූලික සේවාවන්, හරිත හා යහපත් රැකියා සඳහා සියලුදෙනාට ප්‍රවේශය ලබා දෙමින් සැමට වඩා හොඳ ජීවන තත්ත්වයක් සහතික කිරීම ය. මෙම අරමුණ හා බැඳුණු ඉලක්ක 11ක් 2030 වන විට සපුරා ගැනීමට කටයුතු කිරීම තුළින් එක් අතකින් සමස්ත තිරසර සංවර්ධන සැලසුම සාක්ෂාත් කරගැනීමට මෙන්ම ආර්ථික, සමාජ සහ පාරිසරික පිරිවැය අවම කරමින් ආර්ථික තරගකාරීත්වය ශක්තිමත් කිරීමට හා දරිද්‍රතාවය තුරන් කිරීමට ලෝකයේ සියලුම රටවලට හැකි වේ. ලෝකයේ පරිභෝජනය සඳහා සුදුසු ජලය (පානය කළ හැකි) ඇත්තේ 3% කටත් වඩා අඩු ප්‍රමාණයක් වන අතර ඉන් 2.5% ක් ඇන්ටාක්ටිකාව, ආක්ටික් හා ග්ලැසියරවල මිදී අයිස් තත්ත්වයේ ඇත. එබැවින් මිනිසාගේ පරිභෝජනය සහ මිරිදිය අවශ්‍යතා සඳහා 0.5%ක් මත රඳා සිටීමට සිදු වී ඇත. බිලියනයකට වඩා වැඩි පිරිසකට තවමත් පිරිසිදු ජලය සඳහා ප්‍රවේශය නොමැත. සෑම වසරකම ප්‍රවාහනය හා අස්වනු නෙලීමේ ක්‍රියාවලිය හේතුවෙන් නිෂ්පාදිත ආහාරවලින් 1/3 ක් දිරාපත්වීම හෝ නරක්වීම හේතුවෙන් පරිභෝජනයෙන් තොරව බැහැර කරන බව ඇස්තමේන්තු කර ඇත. මෙවැනි තත්ත්වයක් තුළ තිරසර නිෂ්පාදන, පරිභෝජන රටාවකට සහ සම්පත්වල කාර්යක්ෂම භාවිතයට සියලුම සහ සෑම තරාතිරමකම මානව වර්ගයා ප්‍රවේශ නොවුනහොත් 2050 වන විට වර්ධනය වන ජනගහනයට සාපෙක්ෂව ඇති වන මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය අවම ස්වාභාවික සම්පත් සඳහා ග්‍රහලෝක තුනකට ආසන්න ප්‍රමාණයක් අවශ්‍ය වන බව ඇස්තමේන්තු කර ඇත.

ඒක පුද්ගල ගෝලීය ආහාර නාස්තිය අඩකින් අඩු කිරීම, අස්වනු හානිය ඇතුළුව නිෂ්පාදන හා සැපයුම් දාමයන්හි ආහාර නාස්තිය අවම කිරීම, රසායනික ද්‍රව්‍ය හා සියලුම අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීම, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සහ නැවත භාවිත කිරීම තුළින් අපද්‍රව්‍ය උත්පාදනය අඩු කිරීම, තිරසර භාවිතයන් අනුගමනය කිරීමට සමාගම් දිරිමත් කිරීම, තිරසර සංවර්ධනය සහ පරිසර හිතකාමී ජීවන රටා පිළිබඳව සියලුම පුද්ගලයින් තුළ අදාළ තොරතුරු සහ ප්‍රායෝගික භාවිතය පිළිබඳව දැනුම්වත්භාවය ඇති කිරීමට පියවර ගැනීම හරහා මෙම ඉලක්කය ජයගත හැකිය.

13 CLIMATE ACTION

# දේශගුණ විපර්යාස අවම කිරීම: දේශගුණ විපර්යාස හා එහි බලපෑම් අවම කිරීම සඳහා ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම



ඡායාරූපය: www.waste360.com

දේශගුණික ක්‍රියාකාරකම් ආශ්‍රිත ගැටලු රාශියක් මෙම අරමුණ මගින් ආවරණය කරන අතර ඉලක්ක 5කින් සමන්විත වේ. එහි පළමු ඉලක්ක තුන වන "නිමවුම් ඉලක්ක" මගින් දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තන ධාරිතාව ශක්තිමත් කිරීම, දේශගුණික විපර්යාස සඳහා බලපාන සාධක ජාතික ප්‍රතිපත්ති, උපායමාර්ග හා සැලසුම්වලට ඇතුළත් කිරීම, දේශගුණික විපර්යාසයන්ට මුහුණ දීම සඳහා දැනුම හා ධාරිතාවය ගොඩනැගීම හරහා මහජනතාව ඒ සඳහා සූදානම් කරවීම අන්තර්ගත වන අතර ඉතිරි ඉලක්ක දෙක මගින් මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ උපායමාර්ග එනම් දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමු සම්මුතිය ක්‍රියාත්මක කිරීම, සැලසුම් කිරීම සහ කළමනාකරණය සඳහා ධාරිතාව ඉහළ නැංවීමේ යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම ඇතුළත් කර ඇත.

2015 දී තිරසර සංවර්ධන අරමුණු සම්මත කර ගන්නා කාලය දැවැන්ත ලැව්ගිනි, නියඟ, සුළි කුණාටු සහ ගංවතුර වැනි ස්වාභාවික විපත් සිදුවීමේ සංඛ්‍යාතය උග්‍ර කාල වකවානුවක් වේ. 2010-2019 අතර දශකය ඉතිහාසයේ වාර්තා වූ උණුසුම්ම දශකයයි. වර්තමානයේ දේශගුණික විපර්යාස ලෝකයේ සෑම රටකම ගෝලීය ප්‍රජාවට බලපාන අතර එහි බලපෑම ජාතික ආර්ථිකයන්ට පමණක් නොව, විශේෂයෙන් අවදානමට ලක්විය හැකි තත්ත්වයන් යටතේ පසුවන ප්‍රජාවට සහ ඔවුන්ගේ ජීවනෝපායන්ට ද විශාල බලපෑමක් ඇති කර තිබේ. ස්වභාවික ආපදාවල සංඛ්‍යාතය හා තීව්‍රතාවය වර්ධනය වීම, වර්ෂාපතන රටාව වෙනස්වීම, ඉතාමත් ඉක්මණින් දේශගුණික හා කාලගුණික විපර්යාස නිසා ඇතැම් සංවේදී පරිසර පද්ධතීන් තුළ වාසස්ථාන කොට ගෙන සිටිනු ලබන ජීවීන්ගේ පැවැත්මට තර්ජනයක් වීම, මෝසම් රටා සහ නියං තත්ත්ව හේතුවෙන් කෘෂි කර්මාන්තයේ ශක්‍යතාවය අවම වීම මත ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව ගැටලු දේශගුණික විපර්යාස හරහා දැකගත හැකිය. හරිතාගාර වායු විමෝචනය අවම නොවන්නේ නම්, ඉදිරියේ දී විශාල පිරිසකට සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 29කට වඩා වැඩි දේශගුණයක් යටතේ දිවි ගෙවීමට සිදු වනු ඇත. ඒ අනුව දේශගුණික විපර්යාස මගින් සිදුවන අහිතකර බලපෑම අවම කිරීමේ ගෝලීය ප්‍රතිචාරය ශක්තිමත් කිරීම සඳහා 2015 ඇති කරගත් පැරිස් ගිවිසුමට අනුව ගෝලීය උෂ්ණත්වය සෙල්සියස් අංශක 2කට වඩා අඩුවෙන් පවත්වාගෙන යාමට ලෝකයේ රටවල් එකඟ විය.

## ජලයේ ජීවිතඃ තිරසර සංවර්ධනයක් උදෙසා සාගර, මුහුදු හා සමුද්‍රීය සම්පත් සංරක්ෂණය හා තිරසාර භාවිතය



මිනිසුන්ගේ සහ පෘථිවියේ සෞඛ්‍යයමත් පැවැත්මට සමුද්‍ර ජෛව විවිධත්වය අතිශයින් වැදගත් වන බැවින් මෙම අත්‍යවශ්‍ය ගෝලීය සම්පත පරිස්සමින් කළමනාකරණය කිරීම තිරසර අනාගතයක් සඳහා අත්‍යවශ්‍ය අංගයක් වේ. මිනිසුන් විසින් නිපදවන කාබන්ඩයොක්සයිඩ් වලින් 30% ක් පමණ සාගරය අවශෝෂණය කර ගනිමින් ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමේ බලපෑම වළක්වන අතර බිලියන තුනකට අධික ජනතාවක් සිය ජීවනෝපාය සඳහා සාගර හා වෙරළබඩ ජෛව විවිධත්වය මත යැපෙති. කෙසේ වෙතත් වර්තමානයේ දී සාගර දූෂණය හේතුවෙන් වෙරළබඩ ජලය අඛණ්ඩව පිරිහීමට ලක්ව ඇති අතර සාගර ආම්ලීකරණය පරිසර පද්ධතිවල හා ජෛව විවිධත්වයේ ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස මෙන්ම කුඩා පරිමාණ ධීවර කර්මාන්තයට ද අහිතකර බලපෑමක් ඇති කරයි. සෑම වසරකම ප්ලාස්ටික් ටොන් මිලියන 8ක් සාගරයට එකතු වේ. බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් 70% කාර්මික අපද්‍රව්‍ය පිරිපහදු කිරීමකින් තොරව සාගරයට මුදා හරිනු ලැබේ. සමුද්‍ර දූෂණය අවම කිරීම, පරිසර පද්ධති ආරක්ෂා කිරීම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම, සාගර ආම්ලීකරණය අඩු කිරීම, තිරසර මසුන් ඇල්ලීම, වෙරළබඩ හා සාගර ප්‍රදේශ සංරක්ෂණය කිරීම, නීති විරෝධී මසුන් ඇල්ලීම සහ අනෙකුත් විනාශකාරී මසුන් ඇල්ලීමේ ක්‍රම වැළැක්වීම සඳහා නීති සම්පාදනය කිරීම, සමුද්‍ර සම්පත් තිරසර ලෙස භාවිතා කිරීමෙන් ආර්ථික ප්‍රතිලාභ වැඩි කිරීම, විද්‍යාත්මක දැනුම, පර්යේෂණ සහ තාක්ෂණය වැඩි කිරීම, කුඩා පරිමාණ ධීවරයින්ට සහාය වීම, ජාත්‍යන්තර මුහුදු නීතිය ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම ඇතුළු ඉලක්ක 10 ක් මෙම අරමුණ හා බැඳී පවතියි.



ඡායාරූපය: environmentalprogress.org




**මිහිමත ජීවිත:** භෞමික පරිසර පද්ධතිවල තිරසර භාවිතය ආරක්ෂා කිරීම, ප්‍රතිෂ්ඨාපනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම, තිරසර භාවිතයට පෙළඹවීම හා වනාන්තර තිරසර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාරකරණයට එරෙහිව සටන් කිරීම, භූමි හායනය වැළැක්වීම හා ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම.



ඡායාරූපය: www.shutterstock.com

"මිහිමත ජීවිත" කෙරෙහි අවධානය යොමු කරමින් සකස් කර ඇති මෙම අරමුණ ඉලක්ක 12කින් සමන්විත වේ. විශේෂයෙන්ම වන විනාශය නතර කිරීම, විනාශ කළ වනාන්තර නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම, කඳුකර පරිසර පද්ධති හා වැසි වනාන්තර වැනි පරිසර පද්ධති සංරක්ෂණය කර වඳවීමේ තර්ජනයට මුහුණ දී සිටින සත්ව විශේෂ ආරක්ෂා කිරීමට කඩිනම් පියවර ගැනීම, කාන්තාරකරණය අවසන් කිරීම හරහා ඉදිරි පරම්පරාවට ද භුක්ති විඳිය හැකි පරිදි තිරසර ජීවනෝපායන් සුරක්ෂිත කිරීම මෙම අරමුණ යටතේ විශේෂයෙන් සලකා බලයි. තිරසර සංවර්ධන ඉලක්ක කරා යන ගමනේ ප්‍රගතිය තක්සේරු කරමින් එක්සත් ජාතීන්ගේ මහලේකම් විසින් 2020 වසරේ සකස් කරන ලද වාර්තාවේ ජෛව විවිධත්වය හා විශේෂයෙන්ම වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වනාන්තර ප්‍රදේශ අඛණ්ඩව අඩු වෙමින් පවතින බව සඳහන් වේ. 2010 සිට 2015 දක්වා කාලය තුළ ලෝකයට වනාන්තර හෙක්ටයාර් මිලියන 3.3 ක් අහිමි විය. මිනිසුන් ඇතුළු සියලුම ජීවීන් පරිසර පද්ධතීන් සමග අන්‍යෝන්‍ය වශයෙන් බැඳී ඇති බැවින් එය අපගේ ජීවනෝපායට, ආර්ථිකයට, ආහාර සුරක්ෂිතභාවයට, සෞඛ්‍ය සහ සියලුම සත්වයන්ගේ ජීවන තත්ත්ව කෙරෙහි බලපායි.

1800 මුල් භාගයේදී ශ්‍රී ලංකාවේ වනාන්තර ප්‍රතිශතය 70%ක් වූ නමුත් එය ක්‍රමයෙන් 2015 දී 29%ක් දක්වා අඩු වී ඇත. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානය (FAO) ට අනුව, 2005 වසරේ අග භාගයේ සිට සෑම වසරකදීම ප්‍රාථමික වනාන්තරයන්ගේ වන ආවරණය 1% ප්‍රමාණයකින් අහිමි වන රටවල් අතර ශ්‍රී ලංකාව සිව්වන ස්ථානයට පත්ව ඇත. කෘෂිකාර්මික කටයුතු සහ මානව ජනාවාස ඉදිරිකිරීම සඳහා වනාන්තර ප්‍රදේශවල බිම් මායිම් පුළුල් කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ ප්‍රදේශවල මිනිසුන් සහ වන ජීවීන් අතර දැඩි ගැටුම් ඇති වී තිබේ. ඒ අතර අලි මිනිස් ගැටුම වඩාත් බරපතල කාරණයක් බවට පත් වී ඇති අතර අලි මිනිස් ගැටුම හේතුවෙන් වාර්ෂිකව අහිමි වන මිනිස් ජීවිත සංඛ්‍යාවේ සාමාන්‍ය අගය 85ක් වන අතර මිය යන අලි ඇතුන් සංඛ්‍යාව 272 කි.

පරිසර පද්ධතිය සහ ජෛව විවිධත්වය සංරක්ෂණය හා තිරසාරව භාවිත කිරීම සඳහා මූල්‍ය සම්පත් වැඩි කිරීම, තිරසර වන කළමනාකරණය සඳහා මුදල් යෙදවීම සහ දිරිගැන්වීම, භූමිය සදාචාරාත්මක හා සාධාරණ භාවිතය සඳහා පුද්ගලයින් දිරිමත් කිරීම හරහා වන ජීවීන්ට භූමිය කෙරෙහි ඇති අයිතිය සුරක්ෂිත කර මිනිසුන් සහ වනජීවීන් අතර ගැටුම් අවම කිරීම හරහා මෙම අරමුණු දිනා ගැනීමට හැකිය.

16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS

# සැමට සාමය සහ යුක්තිය


ඡායාරූපය: ioe-emp.org

තිරසර සංවර්ධනයක් සඳහා සියලුම දෙනාම අන්තර්කරණය වූ සාමකාමී සමාජයන් ප්‍රවර්ධනය කිරීම, සැමටම යුක්තිය සඳහා ප්‍රවේශය සහතික කිරීම, නීතියේ සාධාරණත්වය ලබාදීමට සහ සියලුම මට්ටම්වල ඵලදායී, වගකීමක් සහිත ආයතන ඇති කිරීම මෙම අරමුණ යටතේ අපේක්ෂා කරයි. ගැටුම්, අනාරක්ෂිත බව, දුර්වල ආයතන සහ යුක්තිය සඳහා ඇති සීමිත ප්‍රවේශය තිරසර සංවර්ධනයට විශාල තර්ජනයක් ඇති කරන සාධක ලෙස සැලකේ. දූෂණය, අල්ලස්, සොරකම් සහ බදු පැහැර හැරීම් සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල්වලට වසරකට ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 1.26 ක් පමණ වැය වේ. ලොව පුරා සිටින ළමයින්ගෙන් සියයට 50 ක් සෑම වසරකම ප්‍රචණ්ඩත්වයට ගොදුරු වේ. සෑම මිනිත්තු 7 කට වරක්, ලෝකයේ කොතැනක හෝ සිටින ළමයෙකු ප්‍රචණ්ඩත්වය හේතුවෙන් මිය යන අතර පීඩා, ගැටුම්, ප්‍රචණ්ඩත්වය හෝ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් හේතුවෙන් 2017 වසර අවසන් වන විට මිලියන 68.5 ක ජනතාවක් බලහත්කාරයෙන් අවතැන් වී ඇත.

2008 වසර හා සසඳන විට, 2016 දී ශ්‍රී ලංකාවේ මිනීමැරුම් අනුපාතය 100,000 කට 2.5 ක් දක්වා ඉහළ ගොස් ඇත. මරණ අනුපාතිකය හා සම්බන්ධ සියලුම ආකාරයේ හිංසනයන් අවම කිරීම, අපයෝජනය, සූරාකෑම, ජාවාරම ඇතුළු ළමයින්ට එරෙහිව සිදුවන සියලු ආකාරයේ හිංසනයන් සහ වධහිංසා අවසන් කිරීම, ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම සහ සැමට යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම, සියලුම ආකාරයෙන් සිදුවන දූෂණ සහ වංචාවන් තුරන් කිරීම, කාර්යක්ෂම, විනිවිදභාවයෙන් යුතු ආයතන සංවර්ධනය කිරීම, ප්‍රචණ්ඩක්‍රියා සහ ත්‍රස්තවාදය තුරන් කිරීම ඇතුළු ඉලක්ක 12ක් මෙම අරමුණ සමග බැඳී පවතියි.

17 PARTNERSHIPS FOR THE GOALS

# පාර්ශවකරණය




තිරසර සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගීතාවය නැවත බලගැන්වීම හා ක්‍රියාත්මක කිරීම අපේක්ෂාවෙන් ගොඩනගා ඇති මෙම අරමුණ ඉලක්ක 17කින් සමන්විත වන අතර එම ඉලක්ක මූල්‍ය, තාක්ෂණය, ධාරිතා වර්ධනය, වෙළඳ හා පද්ධතිමය ගැටලු යන කොටස් පහකට බෙදා ඇත. තිරසර සංවර්ධන අරමුණ අංක 17 යනු වැඩිදියුණු කළ හා වඩා සාධාරණ වෙළඳාමක් සඳහා වූ දැක්මක් මෙන්ම දේශසීමා හරහා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා සම්බන්ධීකරණය කරන ආයෝජන වැඩසටහන් වේ. තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගත හැක්කේ ශක්තිමත් ගෝලීය හවුල්කාරිත්වයකින් සහ සහයෝගයෙන් පමණි. සාර්ථක සංවර්ධන න්‍යාය පත්‍රයකට ගෝලීය, කලාපීය, ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් මූලධර්ම හා සාරධර්ම මත ගොඩනැගුණු පාර්ශවකරණයක් අවශ්‍ය වන අතර, හවුල් දැක්මක් සහ හවුල් අරමුණු මත මිනිසුන් සහ ලෝකය කේන්ද්‍රගත කරයි. සියලුම රාජ්‍යයන් තිරසර සංවර්ධන අභිමතාර්ථ ලඟාකර ගැනීම සඳහා සම්පත් වෙන් කළ යුතුය. සංවර්ධිත රටවල් විසින් සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා මෙම අභිමතාර්ථ සපුරාලීමට සහය විය යුතුය. මේ සඳහා සියලුම තිරසර සංවර්ධන අභිමතාර්ථ ජාතික සැලසුම්වලට අන්තර්ගත කළ යුතු වේ. අදාළ රාජ්‍යන් විසින් තම දේශයට වැදගත් ලෙස බලපාන ගැටලු හඳුනාගත යුතුය. ප්‍රතිපත්ති සම්බන්ධීකරණය හා ප්‍රතිපත්ති සහයෝගීතාව ඇති කිරීම තුළින් ගෝලීය සාර්ව ආර්ථික ස්ථායිතාව වැඩි දියුණු කිරීම, තිරසර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වය වැඩිදියුණු කිරීම, සංවර්ධනය වෙමින් පවතින රටවල ධාරිතාවය වර්ධනය කිරීමට සහාය වීම හරහා මෙම අරමුණු දිනා ගැනීමට හැකිය.

2030 වසරේ තිරසර සංවර්ධනයක් අත්පත් කරගැනීම සඳහා සිදු කරනු ලබන මෙහෙයුම් කටයුතුවල දී අනෙකුත් රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතන

සම්බන්ධීකරණය සිදුකරන්නේ සහ ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දීමෙහි මූලික වගකීම හිමි වන්නේ තිරසර සංවර්ධන කවුන්සිලයට වේ. ගෝලීය ප්‍රතිපත්ති සහ තිරසර පාරිසරික නවෝත්පාදනයන්ට අනුකූලව ජාතික ප්‍රතිපත්ති හා උපායමාර්ගවල සාර්ථකත්වය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ තිරසර වර්ධනයට අඛණ්ඩව පහසුකම් සැපයීම, අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම තිරසර සංවර්ධන කවුන්සිලයේ හි අරමුණ වේ.

Sustainable Development
Council Of Sri Lanka

## තිරසර සංවර්ධන කවුන්සිලය



# 5 අධ්‍යාපන අරමුණ හා එහි ඉලක්කයන්

තිරසර සංවර්ධන අරමුණු අංක 04 යටතේ අධ්‍යාපන අරමුණ දක්වා ඇත. 2030 වසරේදී ලෝකයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සපුරාගත යුතු ඉලක්ක 7 එහි දැක්වෙන අතර ඒවා මගින් අධ්‍යාපනයේ පුළුල් පරාසයක් ආවරණය කරනු ලබයි. කිසිවෙකු මග නොහැර සහභාගිත්ව ප්‍රවේශයකින් සියලුදෙනාම එක් වී දැනුම හා කුසලතා වර්ධනය කර ගැනීම මගින් සිදු වන සමාජ පරිනාමනයක් හරහා සංවර්ධන අරමුණු දිනා ගැනීමට අපේක්ෂිත බැවින් ඒ සඳහා මාධ්‍යය හා ගාමක බලවේගය බවට පත්වන්නේ අධ්‍යාපනයයි. මෙම නිසා සියලු තිරසර සංවර්ධන අරමුණු ජයගැනීමේදී අධ්‍යාපනයට ප්‍රමුඛත්වය ලබාදිය යුතු වේ.

**අධ්‍යාපන අරමුණ:** සියලුදෙනා අන්තර්කරණය වූ සමානාත්මතාවයකින් යුත් ගුණාත්මක අධ්‍යාපනයක් සහ සැමට යාවජීව ඉගෙනුම් අවස්ථා තහවුරු කිරීම

## අධ්‍යාපන අරමුණ යටතේ දැක්වෙන ඉලක්කයන්

- 2030 වන විට සෑම ගැහැනු පිරිමි ළමයකුටම ගුණාත්මක ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය නොමිලේ සහ සාධාරණව ලබාදීම සහතික කිරීම
- සෑම ගැහැනු පිරිමි ළමයකුම පෙර පාසල් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා තිබීම මගින් ගුණාත්මක මුල් ළමාවිය සංවර්ධන කුසලතාවන් ලබාගෙන ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම් වී තිබීම 2030 වන විට තහවුරු කිරීම
- 2030 වන විට සෑම කාන්තාවකටම සහ පිරිමියෙකුටම ගුණාත්මක විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඇතුළු තාක්ෂණ, වෘත්තීය සහ තෘතියීක අධ්‍යාපනයට සමාන ප්‍රවේශ අවස්ථා ලබා දීම සහතික කිරීම
- ජීවනෝපාය සඳහා හෝ ගෞරවාන්විත වෘත්තියකට සහ ව්‍යවසායකත්වයට අදාළ තාක්ෂණික, වෘත්තීය දක්ෂතාවලින් යුත් තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව 2030 වන විට සැලකිය යුතු ප්‍රමාණයක් වැඩි කිරීම
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ස්වදේශීයන් සහ අවදානම් තත්ත්වයන් තුළ සිටින ළමුන් ඇතුළු සීමාවන්ට ලක්වී ඇති අය සඳහා අධ්‍යාපනයේ සියලුම මට්ටම් සහ වෘත්තීය පුහුණුවට සමාන අවස්ථා සහතික කිරීම සහ අධ්‍යාපනයේදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත වූ විෂමතාවන් 2030 වන විට තුරන් කිරීම
- 2030 වන විට සියලු තරුණයින් සහ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම වැඩිහිටියන් සැලකිය යුතු ප්‍රමාණයක් සාක්ෂරතාව සහ අංක භාවිත හැකියාව ලබා ගැනීම සහතික කිරීම

- **තිරසර සංවර්ධනය සහ තිරසර ජීවන රටා, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය, සංස්කෘතිය, සාමය, ප්‍රචණ්ඩත්වයෙන් තොරවීම සමගින් ගෝලීය පුරවැසිභාවය හා විවිධ සංස්කෘතින් ඇගයීම සඳහා ඉගැන්වීම මගින් ඉගෙනුම ලබන සියලුම පුද්ගලයින් 2030 වන විට තිරසර සංවර්ධනය ප්‍රවර්ධනයට අවශ්‍ය දැනුම හා කුසලතාවන් අත්පත් කර ගන්නා බව සහතික කිරීම.**

අධ්‍යාපන අරමුණ යටතේ දැක්වෙන ඉලක්කයන් අතරින් 7 වන ඉලක්කය සුවිශේෂී වේ. අධ්‍යාපන අරමුණ සහ අනෙකුත් තිරසර සංවර්ධන අරමුණු දිනාගැනීමේදී තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව දැනුම්වත් වීමේ සහ අදාළ කුසලතාවයන් ලබා ගැනීමේ වැදගත්කම මෙමගින් අවධාරණය කරනු ලැබේ. මෙයට අමතරව ගෝලීය අරමුණු දිනාගැනීමේදී සමාජයීය වශයෙන් වැදගත් වන්නා වූ ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව දැනුම්වත්වීමේ වැදගත්කම මෙමගින් පෙන්වා දෙනු ලබයි.

මෙම ක්ෂේත්‍ර අතරින් ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන අරමුණු සහ වර්තමාන සමාජයේ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුකාරී තත්ත්වයන් වලට විසඳුම් ලබාදීම සඳහා අපගේ අවධානය යොමු විය යුතු ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්වතාවය, විවිධත්වයට ගරුකිරීම, සාමය හා ප්‍රචණ්ඩත්වයෙන් තොර වීම, ගෝලීය පුරවැසිභාවය පිළිබඳව මෙහිදී සැලකිල්ල යොමුකර තිබේ.



# 6 ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය



ඡායාරූපය: unicef.org

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය යනුවෙන් හැඳින්වෙන්නේ උපතින් උරුමවන්නා වූ ජීව විද්‍යාත්මක සාධක හැරුණු විට සමාජයේ පවත්නා සම්ප්‍රදායයන් චාරිත්‍රවාරිත්‍ර සමාජ ප්‍රතිමාන  හා සමහර නීතිරීති නිසා ස්ත්‍රීන්ට සහ පුරුෂයින් වශයෙන් අසමානතාවයන්ට වෙනස්කොට සැලකීම්වලට ලක් වීමට ඇති හැකියාව අවම කරන ලද තත්ත්වයකි. එබැවින් මේවා ආරෝපනය කරන ලද තත්ත්වයක් වශයෙන් සැලකිය හැකිය.

ලෝකයේ යම් යම් රටවල් සමග සංසන්දනය කරන විට ශ්‍රී ලංකාවේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය යම් ප්‍රශස්ත මට්ටමක පැවැතියත් එය සම්පූර්ණයෙන්ම සුබදායී වාතාවරණයක් ලෙස සැලකිය හැකි නොවේ.  අධ්‍යාපනය සෞඛ්‍ය වැනි සංරචක සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන් යම් වැඩි වාසිදායක තත්ත්වයක සිටී. සෞඛ්‍ය ක්ෂේත්‍රය සැලකිල්ලට ගතහොත් ගැහැනු ළමුන් සහ කාන්තාවන්ගේ හා මාතෘ සෞඛ්‍ය සේවාවන් කාන්තා කටයුතු සඳහා අමාත්‍යාංශ සහ ඔවුන්ගේ සංවර්ධනය වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම මෙහිදී උදාහරණ වශයෙන් හැඳින්විය හැකියි.

අධ්‍යාපන අංශය සැලකිල්ලට ගැනීමේදී පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන් වැඩි අනුපාතිකයක් සියලුම මට්ටම්වලදී විශේෂයෙන් උසස් අධ්‍යාපනයේ නිරතව සිටීම දක්නට හැකිය. මෑත වර්ෂවලදී රාජ්‍ය අංශයේ විශ්වවිද්‍යාල සිසුන් පිළිබඳව අවධානය යොමු කිරීමේදී මේ තත්ත්වය පැහැදිලිව විද්‍යාමාන වේ. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය අතින්ද කාන්තා නියෝජනය ඉහළ අගයක් ගනී.

කෙසේ වෙතත් තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී කාන්තා සහභාගිත්වය ප්‍රමාණවත්

නොවීම සම්බන්ධයෙන් ගැටලු පවතී. තීරණ ගැනීමේ බලය සතු ඉහළ මට්ටමේ තනතුරු දැරීමේදී කාන්තාවන්ගේ නියෝජනය තවමත් ප්‍රමාණවත් අන්දමින් දක්නට නොමැත. එසේම කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය සම්බන්ධයෙන් ගැටලු පවතී. මෙම තත්ත්වය සමනය කිරීම සඳහා පළාත් පාලන මැතිවරණවලදී නාමයෝජනාවලින් 25% ක් කාන්තාවන් සඳහා වෙන් කිරීමට අණපනත් සම්මත කරන ලදී.

මේ හැරුණු විට සමාජයේ පවත්නා නොයෙකුත් සම්ප්‍රදායන් පිළිගැනීම් හා මති මතාන්තර නිසා සමහර රැකියාවන් වෙත ප්‍රවේශ වීම ඒවායේ නිරත වීමෙන් කාන්තාවන් දුර්මුඛ කරන තත්ත්වයන් දක්නට තිබේ. විශේෂයෙන්ම තාක්ෂණික අංශයේ රැකියාවන් කෙරෙහි කාන්තාවන්ගේ නැඹුරු වීම ප්‍රමාණවත් නොවේ.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ සංඛ්‍යාලේඛන පිරික්සීමේ දී අතිශයින් දිළිඳු බවෙන් පෙළෙන්නේ රැකියා විරහිත ග්‍රාමීය කාන්තාවන් බව පැහැදිලි වේ. ස්ථිර ආදායම් මාර්ග නොමැතිවීම ස්වාමියාගේ හෝ වෙනත් අය මත යැපීම ඉඩම් අයිතිය පිළිබඳ සීමාකාරී සාධක යනාදිය මේවාට හේතු වී තිබේ.

ශ්‍රී ලංකාව කාන්තාවන්ට එරෙහිව සිදුවන සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්වලට එරෙහි වීමේ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අත්සන් තබා තිබේ. කෙසේ වෙතත් තවමත් සමාජයේ සෑම මට්ටමකම කාන්තාවන්ට එරෙහිව සිදු වන ප්‍රචණ්ඩත්වයන් වාර්තා වේ.

# 7 මානව අයිතිවාසිකම්




මානව හිමිකම් එසේත් නැතිනම් මානව අයිතිවාසිකම් යන්න අද බොහෝ ජනප්‍රිය මාතෘකාවන් වී තිබේ. සමහර පුද්ගලයින් මෙය තමන්ට බාධාවක් ලෙස දකින අතර සමහරු මෙය තමන්ට රැකවරණය සලසන පළිහක් ලෙස සලකති. එසේම එකම පුද්ගලයාටද අවස්ථා දෙකකදී ඉහත දෙයාකාරයටම මානව හිමිකම් යන්න පිළිබඳව දැනෙන්නටද පුළුවන. කෙසේ නමුත් මානව අයිතිවාසිකම් යනු කිසිම අයෙකුට එරෙහි වන සංකල්පයක් නොවේ. එය මනුෂ්‍ය වර්ගයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස මනුෂ්‍යයා විසින් ආරක්ෂා කර ප්‍රවර්ධනය කළ යුතු සංකල්පයකි.

මිනිසෙකු වීම නිසාම සෑම මිනිසෙකුටම හිමි අයිතිවාසිකම් සමුදායක් මානව හිමිකම් ලෙස සරලව හඳුන්වා දීමට පුළුවන. මෙකී මානව අයිතිවාසිකම් ඉතිහාසය දෙස බලන විට අපට පෙනී යන කරුණක් නම් මානව හිමිකම් පිළිබඳව කතා කිරීම මානව ශිෂ්ටාචාරයේ මුල්ම යුග දක්වාම ගමන් කරන බවයි. මානව හිමිකම් නමින්ම නොවුණත් ශිලා යුගයෙත්, දඩයම් යුගයෙත් එඬේර යුගයෙත්, යම් යම් ආචාර ධර්ම පූජාවන් හා විශ්වාසයන් තුළ මානව හිමිකම් යන්න ගැබ්ව තිබූ බව ඒ පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. එසේම සියලුම ශිෂ්ට සම්මත ආගමික දර්ශනයන් තුළ පදනම මානව හිමිකම් බව එකී ආගම් පිළිබඳව සොයා බැලීමේදී පැහැදිලි වේ.

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිටම මානව හිමිකම් ගැන කතා කළ තරමටම බරපතල ලෙස මානව හිමිකම් උල්ලංඝනය වීම්ද පැවතී ඇති බවට ඉතිහාසය සාක්ෂි දරයි.

විශේෂයෙන්ම ධනය හිමි සුළුතරය විසින් බහුතරය පාලනය කිරීමේ දේශපාලන ක්‍රමය තුළ සැමවිටම පාලක පන්තියත් වරප්‍රසාද හිමි ප්‍රභූන් අතින් මෙම මානව හිමිකම් උල්ලංඝනය වී තිබේ. එයින් පීඩාවට පත් බහුතරය විවිධ අවස්ථාවලදී නැගී සිටීමද ඒ නැගී සිටීමට එරෙහිව පාලකයන් විසින් ගෙන ගිය කෲර මර්ධනයන්ද මානව ඉතිහාසය තුළම දක්නට ලැබේ. මිනිසාට හිමි අයිතිවාසිකම් ලිඛිත ප්‍රකාශ/නීති බවට පරිවර්තනය වූයේ ශත වර්ෂ ගණනාවකට පසුව ය.

මෙම අයිතිවාසිකම් ප්‍රමාණය මෙන්ම එහි ගුණාත්මකභාවය ද සමාජය සංකීර්ණ වන විට විවිධ දිශානතීන් ඔස්සේ වර්ධනය වේ. උදාහරණයක් ලෙස ජීවත් වීමේ අයිතිය ලෙස ප්‍රාථමික සමාජයේ මිනිසා අදහස් කළේ නොමැරී ජීවත්වීමය. නමුත් අද ජීවත් වීමේ අයිතිය යන්නට සුහදායී පරිසරයක සාමකාමී ලෙස අභිමානයෙන් යුතුව ජීවත් වීම අදහස් වේ.

වර්තමානයේ ඉතාමත් වැදගත් මානව හිමිකම් ලේඛනය ලෙස සලකන්නේ වර්ෂ 1948 දෙසැම්බර් මස 10 වන දින එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එළිදක්වන ලද මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයයි. එයින් පසුව එමගින් එළිදක්වන ලද ජාත්‍යන්තර සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, ජාත්‍යන්තර ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය වැනි ප්‍රකාශන හා ප්‍රඥප්ති රාශියක් මගින් මානව හිමිකම් ලේඛන ගත කර ඇත. මෙම ප්‍රඥප්ති මගින් ඒවාට අත්සන් කර තිබෙන රටවල්වල පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට එකී රාජ්‍යයන්ට වගකීම් පැවරීම හා මගපෙන්වීම සිදුකරනු ලබයි. තිරසර සංවර්ධන අරමුණු යටතේ සියලුම දෙනාගේ සහභාගිත්වයෙන් සැම දෙනාම අන්තර්කරණය වූ සමාන අවස්ථාවන් ලබාදීම තහවුරු කිරීම සඳහා මානව හිමිකම් පිළිබඳ ප්‍රඥප්තීන් හා සම්බන්ධ අනෙකුත් සම්මුතීන් වැදගත් දායකත්වයක් ලබාදේ.



ඡායාරූපය: unicef.org

## ශ්‍රී ලංකාවේ මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම්

ඉහත මාතෘකා යටතේ සාකච්ඡා කළ ජාත්‍යන්තර තලයේ මානව අයිතිවාසිකම් අප රටේ පුරවැසියන්ට ශ්‍රී ලංකාව තුළ භුක්ති විඳීමට නම් එවා අපේ රටේ නීතියට ඇතුළත් කර තිබිය යුතුයි. රටේ නීතියට අයිතිවාසිකම් ඇතුළත් කරන්නේ රටේ උත්තරීතර නීතිය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එය ඇතුළත් කිරීමෙන් හෝ ඒ සඳහා විශේෂ අණ පනත් පැනවීමෙනි.

රටක මූලික නීතියට මානව හිමිකම් ඇතුළත් කිරීම සාමාන්‍ය ව්‍යවස්ථා සම්ප්‍රදායයි. ඒ අනුව අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලද මානව හිමිකම් 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළත් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළත් හඳුන්වා ඇත්තේ මූලික අයිතිවාසිකම් ලෙසයි. මේ අනුව අපේ රටේ නීතියේ ආරක්ෂා කර දී ඇති මානව හිමිකම් මූලික අයිතිවාසිකම් ලෙස හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසුව පාලනය වන්නේ 1948 සෝල්බරි ව්‍යවස්ථාව මගිනි. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ මූලික අයිතිවාසිකම් පිළිබඳව විධි විධාන ඇතුළත්ව තිබුණේ නැත. (මානව අයිතිවාසිකම් විශ්ව ප්‍රකාශනය සම්මත කරන ලද්දේ 1948 දෙසැම්බර් මස 12 වන දිනය) නමුත් සෝල්බරි ව්‍යවස්ථාවෙහි 29 (2) වගන්තිය මගින් යම් ජන වර්ගයකට හානිකර වන්නා වූ හෝ යම් ජන වර්ගයකට විශේෂ වරප්‍රසාද හිමිවන ආකාරයේ අණපනත් පැනවීම වළක්වා තිබුණි.

1972 පළමු වරට මූලික අයිතිවාසිකම් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලදී. එහි IV වන පරිච්ඡේදයේ 18 වන ව්‍යවස්ථාව යටතේ, මූලික අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස යනුවෙන් පරිච්ඡෙදයක් අඩංගු වී තිබුණි.

මෙම අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී ජාතික සමගිය හා ඒකාබද්ධතාවය, ජාතික ආරක්ෂාව, ජාතික ආර්ථිකය, මහජන ආරක්ෂාව, මහජන සාමය, මහජන සෞඛ්‍යය ආරක්ෂාව ආදී කරුණු මත සීමා විය යුතු බව එහි දක්වා තිබේ. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යටතේ සඳහන් කර තිබූ මූලික අයිතිවාසිකම් ක්‍රියාත්මක කරවා ගැනීමේ ක්‍රමවේදයක් හෝ අධිකරණයන් පිළිබඳව ව්‍යවස්ථාවේ දක්වා නොතිබීම ප්‍රධාන අඩු පාඩුවක්ව තිබිණි. එසේ නමුත් මෙම අයිතිවාසිකම් කඩ වූ අවස්ථාවලදී සහන ඉල්ලා දිසා අධිකරණවල නඩු පැවරුණ අවස්ථා කිහිපයක් වාර්තා වී තිබේ.

## 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම්

නව ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය වෙන් වී ඇත්තේ මූලික අයිතිවාසිකම් වෙනුවෙනි. මෙම පරිච්ඡේදයේ 10 වන ව්‍යවස්ථාවේ සිට 14 වන ව්‍යවස්ථාව දක්වා සඳහන් වන මූලික අයිතිවාසිකම් පහත පරිදී සංක්ෂිප්ත කළ හැකිය.

- සිතීමේ නිදහස, හෘද සාක්ෂියේ නිදහස හා ආගමික නිදහස
- වධ හිංසාවලින් නිදහස
- සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම හා නීතියේ සමාන රැකවරණය.
- අත්තනෝමතිකව අත්අඩංගුවට පත් වීමේ නිදහස සහ අතීතයට බලපාන පරිදි දණ්ඩන නීතිවලින් නිදහස

- භාෂණයේ, ප්‍රකාශනයේ සහ අදහස් පළ කිරීමේ නිදහස
- සාමකාමීව රැස්වීමේ නිදහස
- සමාගමයේ නිදහස
- වෘත්තීය සමිති පිහිටුවීම හා සාමාජික වීමේ නිදහස
- ආගමික නිදහස
- සංස්කෘතිය භුක්ති විඳීමේ නිදහස
- රැකියාවක නියැලීමේ නිදහස
- ශ්‍රී ලංකාව තුළ යාම් ඊම් යනාදියේ නිදහස සහ වාසය කිරීමේ නිදහස
- ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමේ නිදහස

මෙම මූලික අයිතිවාසිකම් යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් උල්ලංඝනය කර තිබීම හෝ උල්ලංඝනය වීම අත්‍යාසන්න තත්ත්වයක පවතී නම් එවිට ඔහුට හෝ ඇයට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා සහන ලබා ගැනීම පිළිබඳ ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන ව්‍යවස්ථාව දක්වා සිටියි.

විධායක හා පරිපාලන කටයුතු සිදු කරනු ලබන්නේ රජයේ නිලධාරීන් හා ආයතන විසිනි. එබැවින් මූලික අයිතිවාසිකම් කඩවීම්වලදී නඩු පවරා සහන ලබාගත හැකි වන්නේ රජයේ නිලධාරීන්ගේ නිල ක්‍රියාවන්ට එරෙහිවය.

## මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රාජ්‍ය නිලධාරීන් සතු වගකීම්

විධායක හා පරිපාලන නිලධාරීන් විසින් සිදුකරන ක්‍රියාවන්ගෙන් මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදු වුවහොත් ඒ පිළිබඳව සහන ලබා ගැනීමට හැකියාව ඉන් හානියට පත් (අගතියට පත්) පුද්ගලයන්ට ඇත. එයට අමතරව මෙම පරිච්ඡේදයේ සඳහන් මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් රජයේ නිලධාරීන් වෙත පවරා ඇත.

# 8 සාමය සංහිඳියාව සහ තිරසර සංවර්ධන අරමුණු




සාමය යනුවෙන් අදහස් වන්නේ ගැටුම් නොමැති තත්ත්වයයි. ප්‍රාදේශීය දේශීය හෝ කලාපීය මට්ටමෙන් සිදුවන්නා වූ ඕනෑම ආකාරයක සංවර්ධනයක ප්‍රතිලාභ භුක්ති විඳීම සඳහා සාමකාමී වාතාවරණයක් පැවතීම අත්‍යාවශ්‍ය සාධකයකි. කෙසේ වෙතත් වර්තමානයේදී ලොව පුරා විවිධ හේතු සාධකයන් මත පවත්නා විවිධ පරිමාණ ගැටුම් හා අර්බුදකාරී තත්වයන් නිසා සාමයට බාධා ඇති වී තිබේ.

ලෝකය පුරා පැවැති සහ දනට පවත්නා විවිධාකාර වූ ගැටුම් හේතුවෙන් විශේෂයෙන්ම ළමුන් සහ කාන්තාවන් අතිශයින් අනතුරුදායක පීඩාකාරී තත්ත්වයන්ට මුහුණදීමට සහ අවතැන් වීමට ලක්වේ. විශේෂයෙන්ම ලෝකයේ වඩාත්ම දරිද්‍රතාවයෙන් පෙළෙන රටවල් නිරතුරුවම පාහේ අභ්‍යන්තර ගැටුම්වලින් පීඩාවට පත් වන අතර අනෙකුත් රටවල් අසල්වාසී රටවල පවත්නා ගැටුම් හේතුවෙන් විවිධාකාරී අහිතකර බලපෑම්වලට ලක්වේ.

ශ්‍රී ලංකාවේ අවුරුදු 30 පමණ පුරාවට පැවැති ජනවාර්ගික ගැටුම් උත්සන්නවීමත් සමග ඇති වූ යුධමය තත්ත්වය 2009 දී අවසන් වීමෙන් පසුව පොදුවේ සාමකාමී වාතාවරණයක් උදා වී තිබේ. මෙම ජනවාර්ගික ගැටුමට අමතරව 1971 දී සහ 1988-89 කාල සීමාවේදී දකුණේ ඇති වූ තරුණ විප්ලවවාදී ව්‍යාපාර නිසා ද ශ්‍රී ලංකාවේ සාමකාමී තත්ත්වයන්ට විශාල ලෙස බාධා ඇති වී තිබේ. මෙයට අමතරව ඉන් පසුකාලයේදී විශේෂයෙන් ආගමික අන්තවාදය සමගින් ගැටුම්කාරී තත්වයන් නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය වේ. 2019 දී

ඇති වූ ත්‍රස්තවාදී ප්‍රහාරයද මෙවැනි අර්බුදකාරී තත්ත්වයන්ට නිදසුනකි. එබැවින් තිරසර සාමය හා සංහිඳියාව ඇති කරගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සියලු පාර්ශවයන්ගේ වගකීමක් වේ.

ගැටුම්කාරී තත්ත්වයන්ට මූලික වශයෙන් තුඩුදෙන සම්පත් බෙදීයාමේ විෂමතාවය, අනන්‍යත්වය පිළිබඳව ගැටලු, දේශපාලන නිදහස මෙන්ම එකිනෙකට වෙනස් වූ සංස්කෘතීන් හඳුනාගැනීම, ගරුකිරීම සහ පිළිගැනීම ශ්‍රී ලංකාව වැනි බහු සංස්කෘතික බහුආගමික ප්‍රජාවන් වෙසෙන රටකට ඉතා වැදගත් වේ.

මීට අමතරව ආයතනික හා පවුල් මට්ටමින් ද ගැටුම් පැවතීම මගින් සාමකාමී වාතාවරණය බිඳීයාමට හේතු වේ. විශේෂයෙන්ම නොයෙකුත් සාධක හේතු කොටගෙන ඇතිවන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් පවුල්වල සාමකාමී වාතාවරණයක් නොපැවතීම මගින් ළමුන්ට හා කාන්තාවන්ට වඩාත් අයහපත් බලපෑමක් ඇති වේ.

සාම අධ්‍යාපනය යනු ගැටුම් ඇති නොකර ගනිමින් සහ ගැටුම්වලට සම්බන්ධ නොවී ජීවත්වීමට අවශ්‍ය වන්නා වූ කුසලතාවන් ගොඩනංවා ගැනීමයි. සාමය ඇති කිරීම සඳහා උද්දේශන, නීති ප්‍රතිසංස්කරණ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ සමාජ සාධාරණත්වය ඇති කිරීම අත්‍යාවශ්‍ය වේ. සාමය පිළිබඳ අධ්‍යාපනය පාසල් අධ්‍යාපනයට ඇතුළත් කිරීම මගින් අනාගත පරපුර මේ සඳහා යොමුකර ගැනීමට මෙමගින් යහපත් පදනමක් ඇති කරනු ලබයි. ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන අරමුණුවල ප්‍රමුඛතාවයක් වන්නේ සාමකාමී පුරවැසියෙක් බිහි කිරීමයි.

සාමය පිළිබඳ විෂයෙහි ප්‍රවීණයෙකු වන ජෝන් ගැල්ටුන්ගේ අදහස් දැක්වීමට අනුව දෙආකාරයක සාමයක් පැවතිය හැකිය. ඒ සෘණාත්මක සාමය හා ධනාත්මක සාමය වශයෙනි. ඔහු සෘණාත්මක සාමය නිර්වචනය කරන්නේ ප්‍රචණ්ඩත්වය නොමැතිකම, යුද්ධය නොමැතිකම යනුවෙනි. ඔහු ප්‍රචණ්ඩත්වයේ ස්වරූප තුනක් හඳුන්වා දේ. ඒවා නම් සෘජු ප්‍රචණ්ඩත්වය, ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය හා සංස්කෘතික ප්‍රචණ්ඩත්වය යනුවෙනි. ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය යනුවෙන් අදහස් කරන්නේ යම් පුද්ගල කණ්ඩායම් ආන්තීකරණයට පත්කරවනසුලු අසාධාරණ ක්‍රම පද්ධතීන්ය. සංස්කෘතික ප්‍රචණ්ඩත්වය මගින් සෘජු සහ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කරනු ලබන සමාජ ප්‍රතිමාන අදහස් කරනු ලබයි. යුද්ධය සහ අපරාධ වැනි සෘජු ප්‍රචණ්ඩත්වය ව්‍යුහාත්මක සහ සංස්කෘතික ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිඵලයකි.

ගැල්ටුන් පැහැදිලි කරන ආකාරයට ධනාත්මක සාමය යනු මානව සමාජයේ ඒකාබද්ධතාවයයි. ධනාත්මක සාමය සඳහා සෘජු ප්‍රචණ්ඩත්වය මෙන්ම ව්‍යුහාත්මක සහ සංස්කෘතික ප්‍රචණ්ඩත්වයද අවසන් කළ යුතු වේ. සෘජු ප්‍රචණ්ඩත්වයන් වළක්වා ගැනීම සඳහා අසාධාරණ සමාජ ක්‍රමයන් හා පද්ධතීන් නිවැරදි ආකාරයට සකස්කරගත යුතු වේ.




ගැල්ටුන්ගේ ප්‍රචණ්ඩත්වයේ ස්වරූප තුන

## ධනාත්මක සාමය මඟින් තිරසාර සංවර්ධනයක් ඇති වීම තහවුරු කරන්නේ කෙසේද?

ආර්ථිකය සහ සංවර්ධනය පිළිබඳ ආයතනය විසින් ආර්ථික, දේශපාලනික සහ සමාජීය වශයෙන් ධනාත්මක සාමයක් ඇති කිරීමට තුඩු දෙන්නා වූ විශේෂිත සාධක අටක් හඳුනා ගනු ලබයි. මේවා මගින් සාමය ජනිත කිරීමටත් සාමය හා සම්බන්ධ වඩාත් යහපත් ප්‍රතිදානයන් ලෙස සැලකිය හැකි විවිධත්වයට ගරු කිරීම, ආර්ථික සමානාත්මතාවය සහ සෞඛ්‍යමත් පරිසරයට වැනි සාධනීය තත්ත්වයන් ඇති කරන අතර මේවා තිරසර සංවර්ධනයට සම්බන්ධ ගුණාංගයන් වේ.

ධනාත්මක සාමයක් ගොඩනැගෙන්නා වූ සාධක අට එසේත් නොමැති නම් කුළුණු අට වන්නේ

- රජය හොඳින් ක්‍රියාත්මක වීම,
- යහපත් ව්‍යාපාර පසුබිමක් පැවැතීම,
- සම්පත් සමානාත්මතාවයෙන් යුතුව බෙදීයාම
- අනෙක් අයගේ අයිතීන් පිළිගැනීම
- අසල්වැසියන් සමග සුහද සම්බන්ධතාවයක් පැවැතීම
- තොරතුරු නිදහස
- මානව ප්‍රාග්ධනය ඉහළ මට්ටම පැවැතීම
- දූෂණ අවම මට්ටමක පැවැතීම යනාදියයි

ධනාත්මක සාමය මගින් ඔහු පෙන්වා දෙනු ලබන්නේ ගැටුම් අවසක් කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බවත් සත්‍ය සාමයක් සඳහා වූ සාර්ව ප්‍රවේශයක් අවශ්‍යවන බවත්ය. ඉහත දක්වන ලද සාධක අට මගින් සමාජයේ ප්‍රජාවේ යහපත් වාතාවරණයන් ඇති කිරීමට දායක වන අතර මෙතුළින් ජනතාවට අවශ්‍ය මූලික සමාජ සේවාවන් සහ ජීවනෝපාය මාර්ග ලබාදිය හැකි අතර එමගින් තිරසර සංවර්ධනයක් ඇති කරගත හැකිය.

තිරසර සංවර්ධන අරමුණුවලදී ද සාමය හා සංහිඳියාව පිළිබඳව දැඩි අවධානයක් යොමු කර තිබේ. තිරසර සංවර්ධන අරමුණු අංක 17 මගින් සාමය සාධාරණත්වය සහ වගකීමෙන් යුක්ත ආයතන පැවැතීම සම්බන්ධයෙන් අවධාරණයට ලක් කරනු ලබයි.

## සාමාන්‍ය මිනිසුන්ට කළ හැක්කේ කුමක්ද?

පුද්ගලයින් අතර හෝ කණ්ඩායම් අතර ඇති වන ගැටුම් අඩු කිරීමට වෑයම් කරන කවර හෝ පුද්ගලයකු සාමාන්‍ය පුද්ගලයකු නොවේ. සාමය වෙනුවෙන් දැක්මක් කැපවීමක් හා හැකියාවක් ඇති පුද්ගලයින් අසාමාන්‍ය හැකියාවන්ගෙන් යුක්ත අය වේ.

කෙසේ වෙතත් මෙහිදී සාමය ගොඩනැංවීමට න්‍යායාත්මක සංකල්ප පිළිබඳ දැනීමක් අවශ්‍ය බව මෙමගින් අදහස් නොවන අතර අවශ්‍ය වන්නේ ක්‍රියාකාරී බව, නිර්මාණාත්මක චින්තනය, ඉවසීම, ශක්තිමත්භාවය හා ස්ථාවරත්වයයි. මෙසේ වන්නේ ගැටුමක් අවසන් වී සාමය ඇති වීම සඳහා කාලයක් ගත වීමත් අපේක්ෂා නොකළ හැකි තත්ත්වයන් බිහි වීමට ඇති හැකියාවක් නිසාය. සමහර විට ඔබගේ උත්සාහයන් වරදවා තේරුම් ගැනීමට ද හැකිය.

පුද්ගලයින් සහ කණ්ඩායම් අතර ආතතිය අඩුකරලීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග අතරින් අන්තර් ආගමික සාකච්ඡා ඉතා වැදගත් වේ. එකිනෙකා අතර විශ්වාසය ගොඩනංවා ගැනීම සඳහා විවිධ ආගමික නායකයින්ගෙන් සමන්විත කමිටුවක් ගොඩනගා ගැනීමත් එමගින් සාමයට බාධාකාරීවන තත්ත්වයන් අවබෝධ කර ගැනීමටත් ඒවා සමනය කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග සාමූහිකව හඳුනා ගැනීම වැදගත් වේ.

එසේම සාමය උදෙසා සක්‍රීය දායකත්වය ලබාදිය හැකි ඒ සඳහා කැමැත්ත හා හැකියාව පවත්නා පුද්ගලයින් හඳුනා ගැනීම වැදගත් වේ. විධිමත් ක්‍රියාමාර්ගයන්ට වඩා අවිධිමත් ක්‍රියාමාර්ග එනම් මිත්‍රත්වය ගොඩනංවා ගැනීම වැනි පියවරයන් ඔස්සේ සෙමින් සිදු කරන මැදිහත්වීම වඩාත් ප්‍රයෝජනවත් වේ.

සැම විටම පුද්ගලයින් තමන්ගේ කණ්ඩායම නිවැරදි සහ හොඳ ලෙස දැකීමටත් අනෙක් පාර්ශවය වැරදි සහ නරක ලෙස දැකීමටත් පුරුදුව සිටිති. මෙම තත්ත්වය අවබෝධ කර ගැනීමටත් අනෙකාගේ දෘෂ්ඨිකෝණයෙන් පවත්නා තත්ත්වය පිළිබඳව අපක්ෂපාතීව විමසා බැලීම මගින් ගැටුම්වලින් පරිබාහිරව සාමකාමී තත්ත්වයක් ඇතිකර ගැනීමට ඉවහල්වේ.

ක්‍රීඩා හා සෞන්දර්යාත්මක ක්‍රියාවන්ට යොමු කිරීම මගින් ද අන්‍යෝන්‍ය අවබෝධය නාවාලීමටත් ගැටුම්වලට පරිබාහිර විකල්ප පවතිනා බව මිනිසුන්ට අවබෝධ කර ගැනීමටත් මග පාදයි.

# 9 විවිධත්වයට ගරුකිරීම



ඡායාරූපය: action4sd.org

සාමකාමී හා සංහිඳියාවෙන් යුක්ත පරිසරයක් නිර්මාණය කිරීමත් පවත්වාගෙන යාමත් උදෙසා අපි ජීවත්වන සමාජයේ දක්නට ලැබෙන විවිධ වූ සංස්කෘතීන් ඇගයීම් රටාවන් හා සාරධර්මයන්ට ගරුකිරීම හා පිළිගැනීම අත්‍යාවශ්‍ය කරුණක් වේ. මෙමගින් අදහස් වන්නේ සෑම පුද්ගලයකුම සුවිශේෂී වන බව සහ අප අතර පුද්ගලිකව පවත්නා වෙනස්කම් පිළිබඳව හඳුනා ගැනීමත්ය. මෙම වෙනස්කම් ජාතිය, ජාතිකත්වය, ස්ත්‍රීපුරුෂ සමාජභාවය, ලිංගික දිශානතිය, සමාජ ආර්ථික තත්ත්වයන්, වයස, ශාරීරික හැකියාවන්, ආගමික විශ්වාස, දේශපාලන මතයන් හෝ වෙනත් මතවාදයන් විය හැකිය. මෙම වෙනස්කම් ආරක්ෂාකාරී ධනාත්මක සහ සාධනීය වාතාවාරණයක ගවේශණය කිරීම විවිධත්වයට ගරුකිරීම මගින් සිදුවේ. එකිනෙකා හඳුනා ගැනීමත් සෑම පුද්ගලයෙකු තුළම පවතින විවිධත්වයන් පිළිබඳ ගුණාත්මක වශයෙන් ඉහළ දෘෂ්ටීන් පිළිගැනීම හා සැමරීමත් සඳහා සරල වශයෙන් හඳුන්වන ඉවසීමෙන් ඔබ්බට ගමන් කිරීමක් මෙයින් අදහස් වේ.

ප්‍රජාවිද්‍යාත්මක සහ මතවාදී වෙනස්කම්වලින් යුත් පුද්ගලයින් හෝ කණ්ඩායම් විසින් විවිධත්වය නිර්මාණය කරණු ලබයි. පූර්ව විනිශ්චයකින් තොරව සහ සමානාත්මතාවයෙන් හා එකිනෙකාට ගරු කිරීමේ සුහදත්වයකින් යුත් සාධනීය වාතාවරණයක් ඇති කිරීම මගින් පුද්ගලයින්ගේ හෝ කණ්ඩායම්වල විවිධත්වය ආරක්ෂාකිරීම සහ සහාය වීම ඉතා වැදගත් වන්නේ ජනතාවගේ සාමුහික ප්‍රයත්නයන් තුළින් බුද්ධිමය ශක්තිය හා නවෝත්පාදන විසඳුම් ජනිත කරන්නා වූ සහයෝගාත්මක, එකිනෙකාට සත්කාර කරන ප්‍රජාවක් බිහිකර ගැනීමට හැකිවන බැවිනි.



- **මානුෂීය ගුණය, සංස්කෘතීය සහ ස්වභාවික පරිසරය එකිනෙක මත පරායත්තව තිබෙන බව අවබෝධකරගැනීම සහ අගය කිරීම**
- **අපගේ අත්දැකීම් සහ ගුණාංගයන්ට වඩා වෙනස් වූ ඒවා සම්බන්ධයෙන් ගරු කිරීම**
- **පුද්ගලික සංස්කෘතික සහ ආයතනමය වශයෙන් වෙනස්කොට සැලකීම මගින් සමහරුන්ට වැඩි වරප්‍රසාදයන් ලබාදෙන අතර එමගින් සමහරුන්ට අවාසිදායක තත්ත්වයන් ඇති කිරීමටත් පැවැතීමටත් හේතුවන බව වටහා ගැනීම**
- **විවිධත්වයන් අතර සන්ධානයන් ගොඩනැගීම මගින් අපට එකට වැඩ කිරීමටත් සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමට හැකි වේ**


මෙම නිසා විවිධත්වය යන්නට අපට සහ අප අයත් කණ්ඩායම්වලින් පරිබාහිරව වෙනත් පුද්ගලයන් හා කණ්ඩායම් සතුව පවතින වෙනස් වූ මෙම ගුණාංග සහ තත්ත්වයන් සමග කටයුතු කරන්නේ කෙසේ ද යන්න අයත් වේ. අවසාන වශයෙන් වෙනස් තත්ත්වයන් සෑම විටම ස්ථාවරව නොපවතින බවත් ඒවා වෙනස් විය හැකි බවත් අපි පිළිගත යුතු අතර අප ස්වයං හඳුනා ගැනීම සඳහා එකිනෙක පුද්ගලයින්ගේ අයිතිවාසිකම්වලට ගරුකරන අතර එනමුත් යම් අයකුගේ සංස්කෘතිය තවත් අයකුගේ සංස්කෘතියට වඩා උසස් නොවන බවද වටහාගත යුතුය.

# 10 තිරසර ජීවන රටා සහ පරිසරය සුරැකීම

ශ්‍රී ලංකාවේ ඇතිවන ආපදාවන්ගෙන් 96% ක්ම ගංවතුර, අධික සුළං සහ නියඟය වැනි දේශගුණික විපර්යාසයන්ගෙන් ඇති වන බලපෑම් නිසා සිදු වේ, 2018 ගෝලීය දේශගුණික අවදානම් දර්ශකයට අනුව, මේවා මගින් වඩාත්ම බලපෑමට ලක් වූ සිව්වන රට ලෙස ශ්‍රී ලංකාව 2016 වර්ෂයේ ශ්‍රේණිගත විය.

තිරසර සංවර්ධන අරමුණු බොහොමයක් පරිසරය සමග සෘජු සම්බන්ධතාවයක් දක්වයි. අපගේ ලෝකයේ තිබෙන සීමිත සම්පත් අපගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා යොදවා ගැනීමේදී ඒවාට අවම හානියක් ඇති වන පරිදි සහ අනාගත පරපුරේ පරිභෝජනය වෙනුවෙන් සුරැකෙන අයුරින් අරපරිස්සමින් භාවිතාව තහවුරු කිරීම මෙහිදී අපේක්ෂා කරනු ලබයි. තිරසර සංවර්ධන අරමුණු අංක 4.7 යටතේ තිරසර පරිභෝජන රටා ප්‍රවර්ධනය කිරිම යනුවෙන් මූලික වශයෙන් මෙම කරුණු අවධාරණය කරනු ලබයි.

18 වන ශත වර්ෂයේ ඇති වූ කර්මාන්ත විප්ලවයෙන් අනතුරුව පසුගිය සියවසක පමණ කාලය තුළ දී තාක්ෂණික අංශයන්හි ඇති වූ කැපී පෙනෙන දියුණුවත් සමගින් කර්මාන්ත සහ නිෂ්පාදන ක්ෂේත්‍රයේ සිදු වූ ශීඝ්‍ර වර්ධනය තුළින් පොදු පහසුකම් හා ජීවන තත්වයන්හි ප්‍රගතියක් ඇති වී තිබේ. එසේම ලෙඩ රෝග මර්ධනය, එන්නත්කරණය, ස්වස්ථතාවය ඇතුළුව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුවත් මෙහි ප්‍රතිඵලයක් ලෙස මරණ අනුපාතිකය අඩුවීම, උපතේදී ආයු අපේක්ෂාව වැඩි වීම යනාදිය මත ලෝක ජනගහනය ශීඝ්‍රයෙන් වැඩි වී තිබේ. 1920 දී ලෝක ජනගහනය මිලියන 2000 ක් වූ අතර 2020 දී එය මිලියන 7795 බවට පත් වී තිබේ. මෙම ජනතාවගේ පාරිභෝජන අවශ්‍යතා සපුරාලීම සඳහා කෘෂිකර්මය, නිෂ්පාදන හා කර්මාන්ත අංශයේ සංවර්ධනය වැඩි දියුණුව හා දායකත්වය අත්‍යාවශ්‍ය කරුණක් වන අතර කෙසේවෙතත් මෙහි දී ස්වභාවික සම්පත් අධි භාවිතාවක් සිදු වන අතර මෙමගින් පරිසරයට දැඩි ලෙස හානි සිදුවීම ද දක්නට ලැබේ. මේ සඳහා කදිම උදාහරණ ලෙස කෘෂිකර්මය, කර්මාන්ත සහ පාරිභෝජන අවශ්‍යතා සඳහා දැව වර්ග ලබාගැනීම සඳහා සිදු කරනු ලබන වනාන්තර හෙළි පෙහෙළි කිරීම ගත හැකිය. 1920 දී ශ්‍රී ලංකාවේ වනගහනය සමස්ථ භූමි ප්‍රමාණයෙන් 60% වූ අතර 2020 දී එය 29% දක්වා අඩු වී තිබේ.



පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාව පුරා දේශගුණික වෙනස්කම් නිසා සිදු වන කාලගුණික විපර්යාස සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන දරුණු කාලගුණික සිදුවීම් වඩ වඩාත් සුලභ වෙමින් පවතී. මෙය රටට විශාල වශයෙන් බලපාන අතර ගොවීන් හා කෘෂිකාර්මික කම්කරුවන් මෙම විචල්‍යතාවයන්ගෙන් දරුණුතම බලපෑම්වලට මුහුණ දෙති. පසුගිය වසර දහය තුළ වැඩි වූ ගංවතුර හා නියඟය හේතුවෙන් ශ්‍රී ලංකාව පුරා දිළිඳු ගොවීන්ට දැඩි දුෂ්කරතාවලට මුහුණ දී තිබේ තිබේ. ස්වාභාවික සම්පත් මත යැපෙන නිෂ්පාදන ක්‍රියාවලියක් වන කෘෂිකාර්මික අංශය අයහපත් කාලගුණික බලපෑම්වලට නිරන්තරව නිරාවරණය වීම මගින් රටේ ආහාර සුරක්ෂිතතාවයට සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලබයි.

ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබීම සම්බන්ධයෙන් වැඩිම දායකත්වයක් ලැබෙන්නේ මෝසම් වැසිවලින් බැවින් වර්ෂාපතනය සහ වනාන්තර හෙළි පෙහෙළි කිරීම අතර සෘජු සහසම්බන්ධතාවයක් නොමැති වුවත් මෙම තත්ත්වය අපගේ කාලගුණයට සහ දේශගුණයට දැඩි බලපෑමක් එල්ල කරනු ලබයි. වන ගහනය අඩු වීම මත අධික හිරු රශ්මියක් පොළොව මත පතිත වීමත් ඉතා ඉක්මනින් පොලවේ ජලය වාෂ්ප වී ඉඩෝරය සහ නියගය වැනි තත්ත්වයන්ට වැඩි වැඩියෙන් මුහුණුදීමට සිදුවේ. පරිසරයේ උෂ්ණත්වය ඉහළයාම මත ශාක මගින් සිදුවන උත්ස්වේදනය වැඩි වී පොලවේ ජල මට්ටම තවදුරටත් පහළ යයි. ජනතාවගෙන් වැඩි පිරිසක් කෘෂිකර්ම අර්ථක්‍රමයක් මත ජීවත්වන බැවින් සහ එයින් වැඩි පිරිස් ජලය වැඩි වශයෙන් අවශ්‍ය වන භෝග වන වී වගාව වැනි කටයුතුවල නිරත බැවින් අපගේ කෘෂිකාර්මික කටයුතු සඳහා වැඩි ජලප්‍රමාණයක් අවශ්‍ය වේ.  මේ අනුව වැව් සහ ජලමූලාශ වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගැනීමටත් ඒවා ඉක්මනින් සිඳීයාමත් සිදු වේ.

1961 සිට 1990 දක්වා කාලසීමාව හා සසඳන විට අපේක්ෂිත හා පුරෝකථනය කරන ලද දේශගුණික විපර්යාසයන් නිසා මහ (හෝ වර්ෂා ජලය උපයෝගී කර ගන්නා) කන්නයේ වී නිෂ්පාදනය සඳහා වන වාරිමාර්ග ජල අවශ්‍යතාවය 2050 වන විට සියයට 13-23 කින් ඉහළ යාමට හේතු විය හැකිය. උෂ්ණත්වය ඉහළ යාම, දේශගුණික විචල්‍යතාවයන් සහ වර්ෂාපතනය ලැබෙන කාලය වෙනස් වීම, වර්ෂාපතනයේ තීව්‍රතාවය සහ පරිමාවේ වෙනස් වීම් සහ කාබන් ඩයොක්සයිඩ් මට්ටම ඉහළ යාමෙන් ඇතිවන බලපෑම පිළිබඳ තවමත් අවිනිශ්චිතතාවයන් පවතින අතර, මෑත නිරීක්ෂණවලින් පෙනී යන්නේ උෂ්ණත්වයේ වෙනස්වීම් සහ පාංශු තෙතමනය කෘෂිකර්මාන්තයට අහිතකර ලෙස බලපාන බවයි.


වනගහනය අඩුවීම නිසා අධික වර්ෂාවට පොළව සෘජුව නිරාවරණය වීම තුළින් පස් තට්ටු දුර්වල වී නායයාම් සහ ජලය ගලායෑමේ සීඝ්‍රතාවය වැඩි වී ගංවතුර තත්ත්වයන්ට මුහුණදීමට සිදු වීම නිරන්තරයෙන් දක්නට ලැබෙන සංසිද්දියක් බවට පත් වී තිබේ. අධික තීව්‍රතාවයකින් යුත් වර්ෂාපතනය පාංශු ඛාදනයකට හේතු වේ. ජලය ගලා යාමේ වේගය වැඩි වීම මගින් ජලාශවල රොන්මඩ තැන්පත් වීමෙන් ජල ධාරිතාව  අඩු වීම මෙන්ම  පොළවේ ජලය රඳවා තබා ගැනීමට ඇති හැකියාව අඩු වීමෙන් ජලමූලාශ්‍ර නැවත පෝෂණය දුර්වල කරනු ලබයි. අසාමාන්‍ය හදිසි ගංවතුර තත්ත්වයන් වාරිමාර්ග යෝජනා ක්‍රමවල සහ ඇළවේලි  ව්‍යුහයන්ගේ ඉදිකිරීම්වලට හානි කරයි. මෙවැනි තත්ත්වයන් මගින් ජීවිත හා දේපළ හානි රාශියක් වාර්තාවන  අතර දිගුකාලීන වශයෙන් ආර්ථික අභියෝග යන්ට මුහුණදීමට සිදුවේ.

මේ සමගම ජල ගැලීම් නායයාම් නියඟ සහ වසංගත වැනි අතිශය දරුණු දේශගුණික සිදුවීම් නිසා අධ්‍යාපනයට නිරතුරුව බාධා ඇති වී තිබේ. පුද්ගලයින් අවතැන් වූ කාල සීමාවන්හි දී ආගන්තුක සත්කාර සපයන ප්‍රජාවන්වල පාසල් මෙම අවතැන් වූවන්ට වාසස්ථාන ලෙස යොදාගැනීම සිදුවන අතර මෙම නිසා ආපදාවන් මගින් සෘජුව බලපෑම්

ඇති නොවුවත් එම පාසල් වාසස්ථාන ලෙස ලබාදීම සඳහා තාවකාලිකව වසා දැමීමට සිදු වී ඇත. නිතර සිදුවන ආපදා සිදුවීම් නිසා ළමුන්ට පාසල් යාමට නොහැකි වන දින ගණන් වැඩි වී ඇත. කෙසේවෙතත් නිතරම ඇතිවන ආපදා තත්ත්වයන් තුළින් ළමුන් පාසල් නොපැමිණීමට කොතරම් දුරට බලපෑමක් සිදු වී තිබේ ද එමගින් ශ්‍රී ලංකාවේ ළමුන්ගේ සමස්ථ අධ්‍යාපනයට කොරම් බලපෑමක් සිදු වී තිබේ ද යන්න විශ්ලේෂණය කිරීමට අධ්‍යයන සිදු වී නොමැත.

රටේ බලශක්ති අවශ්‍යතාවයෙන් සැලකිය යුතු ප්‍රතිශතයකට දායකත්ව ලබාදුන් ජල විදුලිබල ක්ෂේත්‍රයට ද මෙමගින් දැඩි බලපෑමක් ඇති වී තිබෙන අතර අද වනවිට විදුලිබලය උත්පාදනයෙන් 68% ක් ඛනිජ තෙල් සහ ගල් අඟුරු වැනි වෙනත් බලශක්ති මූලාශයන් උපයෝගී කර ගැනීමට සිදු වීම තුළින් ආර්ථික වශයෙන් මෙන්ම පාරිසරික වශයෙන්ද දැඩි අභියෝගයන්ට අපට මුහුණ දීමට සිදු වී තිබේ.

ශ්‍රී ලංකාවේ අද වන විට විදුලිබල උත්පාදනය




පරිසර උෂ්ණත්වය ඉහළ යාම පසුගිය දශක කිහිපය තුළ දී අඛණ්ඩව දකින්නට ලැබුණු අතර දිවා කාලයේ උපරිම හා රාත්‍රී කාලයේ වායුවේ අවම උෂ්ණත්වය වැඩි වීමේ පැහැදිලි ප්‍රවණතාවයක් රටේ බොහෝ කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවලින් වාර්තා කරනු ලබන අතර පරිසරය උණුසුම් වීමේ පැහැදිලි ප්‍රවනතාවයක් දේශගුණික විද්‍යා අධ්‍යයන කිහිපයක්ම පෙන්වා දෙන ලබයි. සෑම දිස්ත්‍රික්කයකම උණුසුම් දින සහ උණුසුම් රාත්‍රී ගණන වැඩි වී තිබේ. සියලුම වසරවල සිසිල් දිනයන්ට වඩා උණුසුම් දින වාර්තා වී ඇත.

පරිසරය විනාශ වීමට මූලික වශයෙන් බලපාන පොසිල ඉන්ධන භාවිතය අවම කිරීමටත් ඒ වෙනුවට පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රවෙත මාරුවීමේ අවශ්‍යතාවය දැඩිව දැනෙන අවධියකට පැමිණ තිබේ. මේ සඳහා මූලික ක්‍රියාමාර්ග ගනිමින් පවතින නමුත් ඒවා කඩිනම් කිරිමේ අවශ්‍යතාවයක් පවතී. මානව ක්‍රියාකාරකම් තුළින් පරිසරයට සිදුවන බලපෑම කෙටිකාලීනව අදාළ ප්‍රදේශයට පළාතට හෝ රටට සීමා වුවත් මෙහි හානිකර ප්‍රතිඵලවලට සමස්තයක් වශයෙන් ලෝකවාසී සියලුදෙනාම මුහුණදීමට සිදුවේ. ලෝකයේ දේශගුණික වෙනස්කම්වලට මූලික හේතුවක් වන හරිතාගාර ආවරණයට දායක වන කාබන්ඩයොක්සයිඩ් විමෝචනයෙන් 80% කට පමණ දායකවන්නේ රටවල් 19 කි.

එනමුත් මෙහි බලපෑම සමස්ත ලෝකයටම ඇති වන අතර විශේෂයෙන් දරිද්‍රතාවයෙන් සහ ගැටුම්වලින් පීඩාවට පත් වූ රටවලට අසමමිතික සෘණ බලපෑමක් ඇති කරනු ලබයි. එසේම ජලය, සාගරය සහ ඛනිජ සම්පත් අධි භාවිතය නිසා ද ඒවා වියැකී යාමට සහ අසීමාන්තික භාවිතයෙන් ඇති වන හානිකර පාරිසරික බලපෑමේ අහිතකර

ප්‍රතිවිපාකයන්ට සමස්ත ලෝක ප්‍රජාවටම මුහුණුදීමට සිදු වී තිබේ. මෙම තත්ත්වයන් පාලනය කිරීමට හා නියාමනය කිරීමට ජගත් මට්ටමින් සම්මුතීන්වලට එළැඹීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නායකත්වයෙන් කටයුතු කර තිබේ. මෙහිදී 1998 දී අත්සන් තබන ලද කියටෝ ප්‍රඥප්තිය මගින් මෙහි මූලාම්භය සටහන් කරන අතර කාලගුණික වෙනස්කම් සම්බන්ධයෙන් ක්‍රියාකාරීමට නීතිමය බැදීමකට මුලපිරීමක් සිදු වූ 2015 දී අත්සන් තබන ලද පැරිස් සම්මුතිය ද වැදගත් වේ. මෙවැනි සම්මුතින් ගණනාවක් පවතින අතර තිරසර සංවර්ධන අරමුණු මගින් ද මේවා ශක්තිමත් කිරීමත් ඒවාට සියලු රටවල් සහ පාර්ශවයන්ගේ දායකත්වය ලබා ගැනීමට අවස්ථාව හා යාන්ත්‍රණයක් සැකසීම සිදු වී තිබේ.

රටක සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේදී මහා පරිමාන හා දිගුකාලීන ක්‍රියාමාර්ග වශයෙන් පරිසරය සුරැකීමට ගනු ලැබෙන උපාය මාර්ග සකස් කිරීම අතිශයින් වැදගත් වේ. ඒ සමගින්ම පුද්ගලිකව රටේ පුරවැසියන් වශයෙන් මේ සම්බන්ධයෙන් මහත් දායකත්වයක් එදිනෙදා ජීවිතයේදී ලබාදිය හැකි බව අවබෝධ කර ගැනීම වැදගත් වේ. අප විසින් දැනට අනුගමනය කරනු ලබන නාස්තිකාර අධි පරිභෝජන රටාව වෙනස් කරලීම පිළිබඳව සිතා බැලීම සැමගේ වගකීමක් වේ. මෙහිදී සම්පත් භාවිතය අවම කිරීම නැවත නැවත භාවිතය සහ ප්‍රතිචක්‍රිකරණය කරන ක්‍රියාමාර්ග කෙරෙහි අපි පෞද්ගලිකව අවධානය යොමු කළ යුතුව තිබේ. උදාහරණ වශයෙන් ජලය භාවිතා කිරීම ගතහොත් කෘෂිකර්ම ක්ෂේත්‍රයේදී ජලය අපතේ යාම අධිකව සිදුවන අතර ගෘහස්ථ පරිභෝජනය සඳහා නිකුත් කරනු ලබන පානීය ජලයෙන් 23% අපතේ යන බව සංඛ්‍යාලේඛනවල දැක්වේ. ගෘහස්ථව පාරිභෝජනය කරන ජලය භාවිතය අඩු කිරීම, නැවත භාවිතය සහ ප්‍රතිචක්‍රීයකරණය පිළිබඳව අප ප්‍රමාණවත් අවධානයක් යොමු කර තිබේ ද යන්න සිතා බැලිය යුතුය.

අවශ්‍ය නොවන එක් විදුලි බුබුලක් නිවා දැමීම, ප්‍රයෝජනයට නොගන්නා විදුලි පංකාවක් ක්‍රියාවිරහිත කිරීම මගින් පෞද්ගලිකව ඒ සඳහා ගෙවීමට සිදුවන ගාස්තුව අවම කර ගැනීමට පමණක් නොව බලශක්තිය සඳහා රටක් වශයෙන් වැය කිරීමට සිදුවන විදේශ විනිමය ඉතිරි කර ගැනීමට හා සීමිත සම්පත් යොදා නිෂ්පාදනය කර තිබෙන අදාළ උපකරණයේ ආයු කාලය වැඩි කර ගැනීමටත් එමගින් පරිසරය සුරැකීමට දායක වෙමින් තිරසර සංවර්ධන ක්‍රියාවලියට දායකත්වය ලබාදෙමින් වඩාත් යහපත් ලොවක් බිහි කිරිමට හැකිවනු ඇත.



# 11 තිරසර සංවර්ධන අරමුණු දිනා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගෙන තිබෙන වැදගත් පියවර

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයට 2015 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාව අත්සන් තැබූ දින සිට, තිරසර සංවර්ධන විෂයභාර කැබිනට් අමාත්‍යාංශයක් හඳුන්වා දී තිබේ. එසේම තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ තිරසර සංවර්ධන පනත බලාත්මක කිරීම ඇතුළු තිරසර සංවර්ධන ඉලක්ක (SDG) ළඟා කර ගැනීමේ අරමුණෙන් යුතුව ශ්‍රී ලංකා රජය විවිධ ධනාත්මක පියවර ගණනාවක් ගෙන ඇත.

**1** 2030 න්‍යාය පත්‍රයට 2015 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාව අත්සන් තැබීම

**2** තිරසර සංවර්ධන පනත 2017 දී පාර්ලිමේන්තුවේ සම්මත කර තිරසර සංවර්ධන කවුන්සිලය පත් කරන ලදී. ජාතික තිරසර සංවර්ධන ප්‍රතිපත්තියක් හා උපායමාර්ගයක් සැකසීමට සහ තිරසර සංවර්ධන අරමුණු සමග එකාබද්ධ වන ජාතික වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රයත්නයන් ගණනාවක් දරන ලද මුත් මෙම පියවරයන් සම්බන්ධීකරණයෙහි දුර්වලතා දක්නට තිබේ.

**3** තිරසර සංවර්ධන අරමුණු ප්‍රධාන කරගත් රාජ්‍ය සේවා සැපයීමේ උපායමාර්ගික සැලැස්ම තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් 2018 වසරේදී එළි දක්වන ලදී.

**4** 2019 ඔක්තෝබර් 03 වැනි දින ජනාධිපති ලේකම් කාර්යාලය විසින් චක්‍රලේඛයක් නිකුත් කරමින් තිරසර සංවර්ධන කවුන්සිලය විසින් තිරසර සංවර්ධනය සඳහා ජාතික මට්ටමේ ප්‍රතිපත්ති හා උපායමාර්ගික සැලැස්මක් සැකසීම ආරම්භ කරන බව දැනුම්දුන් අතර ඒ අනුව සියලුම රාජ්‍ය ආයතන සහ පළාත් සභා, 2030 දී තිරසර ලෙස සංවර්ධනය වූ ශ්‍රී ලංකාවක්, යන්න තම පොදු දැක්ම කරගෙන අදාළ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ආයතනයේ උපායමාර්ගයන් හා කාර්යභාරයන් සැකසිය යුතුවේ.

**5** නව රජයේ තිරසර සංවර්ධන ප්‍රතිපත්ති

නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන සෞභාග්‍යයේ දැක්මේ 08 වැනි පරිච්ඡේදයේ තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති දැක්වේ. මෙහි ප්‍රධාන වශයෙන් සලකා බලන අංශ 05 ක් සඳහන් වේ. එනම්,

1. පරිසරය සංරක්ෂණය සහ ආරක්ෂාව සඳහා වූ රෙගුලාසි සැකසීම
2. දැනට පවත්නා පරිසරය හා සම්බන්ධ ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම
3. තිරසර සංවර්ධන අරමුණු සංවර්ධන වැඩ සැලසුම්වලට අන්තර්ගත කිරීම
4. දේශීය දැනුම සහ තාක්ෂණය තිරසර සංවර්ධන අරමුණු දිනා ගැනීමට උපයෝගී කර ගැනීම
5. ජීවන තත්වයන් නංවාලීම සඳහා සියලුම පරිපාලනමය මට්ටම් සම්බන්ධීකරණය කිරීම

තිරසර සංවර්ධන ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ගික දළ සැලැස්ම තිරසර සංවර්ධන සභාව විසින් 2020 අගෝස්තු මාසයේ දී ඉදිරිපත් කරන ලදී. මෙහි එක් එක් අරමුණ දිනා ගැනීම සඳහා සමස්ථයක් වශයෙන් අනුමනය කරන උපායමාර්ගයන් සහ ඒ ඒ ඉලක්කය ලඟාකර ගැනීම සඳහා උපයෝගී කරගනු ලබන සුවිශේෂී උපායමාර්ග සඳහන් වේ. මෙයට අමතරව තිරසර සංවර්ධන සභාව විසින් ශ්‍රී ලංකාව සඳහා වූ තිරසර සංවර්ධන දර්ශක ඉදිරිපත් කර තිබේ.

ගෝලීය තිරසර සංවර්ධන වාර්තාව 2021 ට අනුව ශ්‍රී ලංකාව සංවර්ධන දර්ශකයේ ලකුණු 68.1 ලබාගෙන රටවල් 165 අතරින් 87 වැනි ස්ථානයේ රැඳී සිටි.

**තොරතුරු ලබාගත් මූලාශයන්**


https://www.undp.org
https://www.un.org/sustainabledevelopment
https://www.globalgoals.org
https://cedsrilanka.org Text
https: www.adb.org
UN REDD Programme



CED Sri Lanka

Quality Education For All

# අධ්‍යාපන සංවර්ධන සන්ධානය


අංක 51/1, සිල්වා පටුමග,

රාජගිරිය

දුරකතනය: 112 887642

විද්‍යුත් තැපෑල: cedsrilanka@yahoo.com

වෙබ් අඩවිය: www.cedsrilanka.org



ISBN 978-624-600-200-8

9 786246 002008